ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා

# නව අධ්‍යාපන ප්‍රතිපත්ති හා යෝජනා



අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු උපදේශක

කාරක සභාවට ඉදිරිපත්වූ යෝජනා ඇසුරිනි

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුසාරයෙන් අධ්‍යාපන පනතක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාව
පිළිබඳ දේශපාලන මතවාද, සම්ප්‍රදායික අගයන්, ප්‍රමුඛතා සහ
අනාගත දැක්ම පිළිබිඹු කරමින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක්
අපේක්ෂා කරන්නන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳව විභාග කොට
වාර්තා කිරීම සඳහා පත් කරන ලද

***අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ***

***සාමාජිකයන් වෙත***

## *ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධනයන්*

***විසින් පිළිගන්වනු ලබන වාර්තාවයි.***

# අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ
# පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව

**ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා (සභාපති)**

ගරු එස්. බී. දිසානායක මැතිතුමා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා

ගරු රවුෆ් හකීම් මැතිතුමා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා

ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා

ගරු නිර්මල කොතලාවල මැතිතුමා

ගරු කබීර් හෂීම් මැතිතුමා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා

ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා

ගරු සිවශක්ති ආනන්දන් මැතිතුමා

ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මැතිතුමා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා

ගරු පී. පියසේන මැතිතුමා

ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා

ගරු ජේ. ශ්‍රී රංගා මැතිතුමා

ගරු රජීව විජේසිංහ මැතිතුමා

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මැතිතුමා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය)**

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා (අධීක්ෂණ මන්ත්‍රී, අධ්‍යාපන)**

# අන්තර්ගතය


පිටුව

**සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති පසුබිම** vii

**අරමුණු හා මාර්ගෝපදේශ මූලධර්ම** 1

1.1 ජාතික පොදු අරමුණු 1
1.2 මාර්ගෝපදේශ මූලධර්ම 2

**2. අධ්‍යාපන පද්ධතිය - ව්‍යුහය සහ කාර්යභාරය** 5

2.1 මධ්‍යම අධිකාරිය 6
2.2 පළාත් අධ්‍යාපන අධිකාරිය 9
2.3 ව්‍යවස්ථාපිත මණ්ඩල 9
2.4 පාසල් පද්ධතිය 10
2.5 අනිවාර්යය අධ්‍යාපනය 10
2.6 පෙර පාසල් අධ්‍යාපනය (මුල් ළමාවිය සංවර්ධනය හා සුරැකුම) 11
2.7 අන්තර්කරණ අධ්‍යාපනය ; අවාසිදායී ළමයින්ගේ අධ්‍යාපනය 11

**3. අධ්‍යාපන පද්ධතිය - අන්තර්ගතය හා ක්‍රියාවලිය** 13

3.1 ප්‍රාථමික හා ද්විතීයික විෂයමාලා සංවර්ධනය 13
3.2 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය 15
3.3 ඉගැන්වීමේ මාධ්‍යය 18
3.4 තක්සේරුව හා ඇගයීම 18
3.5 පෙළපොත් 19
3.6 මඟ පෙන්වීම සහ උපදේශනය 19
3.7 අධ්‍යාපන ක්‍රියාවලියෙහි ලා දෙමාපිය කාර්යභාරය 20
3.8 සාරධර්ම අධ්‍යාපනය 21
3.9 අධ්‍යාපන තාක්ෂණය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය 22
3.10 ඉගෙනීමේ පරිසරය සහ පාසල්වල ඇති යටිතල පහසුකම් 23
3.11 පෞද්ගලික උපකාරක පන්ති 23
3.12 සන්නිවේදන මාධ්‍ය හා දරුවා 24
3.13 පුහුණුව මුල්කරගත් සේවය 24

**4. අධ්‍යාපන කළමනාකරණය සහ නායකත්වය** 25

4.1 සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ කළමනාකරණය 25
4.2 පාසල් කළමනාකරණය හා නායකත්වය 26
4.3 අධ්‍යාපන සැළසුම් ක්‍රියාවලිය 26
4.4 අධ්‍යාපන කළමනාකරණය හා තොරතුරු පද්ධතිය 27
4.5 පාසල් අධීක්ෂණය හා මඟ පෙන්වීම 27
4.6 අධ්‍යාපන පර්යේෂණ 28
4.7 කාර්යසාධන හා පසු විපරම 29
4.8 සිසු විනය කළමනාකරණය 29

**5. අධ්‍යාපන කාර්යමණ්ඩලය 31**

❖ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන්

5.1 ගුරු අධ්‍යාපනය 31
5.2 ගුරු ආචාර ධර්ම පද්ධතිය 33
5.3 ගුරු අධ්‍යාපනඥයින්ගේ වෘත්තීය සංවර්ධනය 33
5.4 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිළධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය 33
5.5 අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සේවා 34
❖ ශ්‍රී ලංකා ගුරු සේවය 34
❖ ශ්‍රී ලංකා විදුහල්පති සේවය 35
❖ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය 35
❖ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය 36

**6. අධ්‍යාපන ප්‍රමිතිය සහ ගුණාත්මක තහවුරුව 37**

**7. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් සම්පත්කරණය හා මූල්‍යකරණය 39**

**8. වෘත්තීය අධ්‍යාපනය 41**

**9. පිරිවෙන් අධ්‍යාපනය 43**

**අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ව්‍යුහය 45**

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කළමනාකරණ ව්‍යුහය 46**

**කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කළමනාකරණ ව්‍යුහය 47**

**යෝජිත අධ්‍යාපන අවස්ථාවන්ගේ සටහනක් 48**

# සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති පසුබිම

අතීතයේ ලංකාවේ සාම්ප්‍රදායික අධ්‍යාපන ආයතන ලෙස ක්‍රියාත්මක වූයේ පන්සල්, පිරිවෙන් හා කෝවිල් ආදිය යි. පෘතුග්‍රීසි, ලන්දේසි ආක්‍රමණවලින් පසු ඔවුන්ගේ ආගම් පදනම් කර ගත් අධ්‍යාපන ආයතන ද ඇති විය. ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු වර්තමාන අධ්‍යාපන ක්‍රමයට මුලපිරුණි. එමඟින් විෂයමාලා ඇතුළත් පාසල් ක්‍රමයක් ව්‍යාප්ත වූ නමුත්, සැමට සමාන අධ්‍යාපන අවස්ථා නොලැබුණි. 1930 වන විට ඉංග්‍රීසි භාෂාව මුල් කරගත් වාසිදායක මට්ටමක පැවති ප්‍රභූ අධ්‍යාපනයක් නිරිතදිග හා උතුරු ප්‍රදේශවල ද, අනෙක් ප්‍රදේශවල දේශීය භාෂා මුල්කරගත් අඩු මට්ටමේ අධ්‍යාපන ක්‍රමයක් ද පැවතුණි.

1931 සර්වජන ඡන්ද බලය හඳුන්වා දීමෙන් ඇති වූ සමාජ පරිවර්තනයත් සමඟම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන විධායක කමිටුව හරහා අධ්‍යාපන ක්‍රමයේ තියුණු වෙනස්කම් ආරම්භ වූයේ ය. 1939 අධ්‍යාපන ආඥාපණත හඳුන්වා දීමෙන් පසු අධ්‍යාපන පරිපාලනයේ යටත් විජිත බල ව්‍යුහය දෙදරා ගියේ ය. 1940 දශකයේ මධ්‍යම පන්තියේ සංක්‍රමණයත්, ව්‍යවස්ථාදායක සභාවේ දේශීය නියෝජනය වැඩිවීමත් සමඟම අධ්‍යාපනයේ සමානතාවය හා ගුණාත්මකභාවය වර්ධනය වන්නට පටන් ගත්තේය. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාල නිසා අඩු ආදායම් ලැබූ ජන සමාජයේ දරුවෝද ශිෂ්‍යත්ව හරහා හොඳ ද්විතීය අධ්‍යාපනයට හිමිකම් කීහ. මෙකී කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා ප්‍රාථමික මට්ටමේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දීමේ ඉතිහාස ගත සංසිද්ධිය ඇරඹුණි. 1950 දශකයේ ඉගැන්වීමේ මාධ්‍ය ලෙස මවුබස හඳුන්වාදීමත්, සමාජ සංස්කෘතික පුනරුදයත් සමඟ පුළුල් පාසල් ජාලයක් ඇතිවීමත් සමඟ ම අධ්‍යාපන ක්‍රියාවලියට ඇතුළු වන දරුවන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි විය. ආගම, භාෂාව හා ලිංගිකත්වය අධ්‍යාපනයට අවහිරයක් නොවීම, ප්‍රවාහන සහනාධාර, නොමිලේ දිවා ආහාරය සැපයීම හා අනෙකුත් සුභසාධන වැඩසටහන් නිසා දිළිඳු පවුල්වල දරුවන් ද පාසලට ආකර්ෂණය වූ නිසා පාසල් සහභාගීත්වය හා සාක්ෂරතාවය විශ්මයජනක ලෙස ඉහළ ගියේ ය. කෙසේ වුවද කාලය ඉක්මී යාමේ දී මේ ප්‍රමාණාත්මක වර්ධනයට සරිලන පරිදි අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දියුණු නොවී ය. අධ්‍යාපනයේ නිමැවුම වැඩ ලෝකයට බද්ධ නොවීම හේතුවෙන් ආර්ථික සංවර්ධනය දුර්වල වූ අතර, විරැකියාව නිසා 1970-80 දශකවල උගත් තරුණයෝ කැරලි ගැසූහ. ඒ ප්‍රශ්න ආශ්‍රිත ව ඇති වූ ප්‍රතිසංස්කරණ නිසා ද්විතීය මට්ටමේ විෂයමාලා සමබර කරනු ලැබී ය.

1987 වර්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයත් සමඟ ම අධ්‍යාපන ක්‍රියාවලිය පළාත් මට්ටමෙන් විමධ්‍යගත විය. පාසල් පාදක ඇගයීම් හරහා සමභවන හා සම්පිණ්ඩිත ඇගයීම් බද්ධ කිරීමට වෙර දරනු ලැබී ය. තවද ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය ස්ථාපනය කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයන්ගේ සේවා තත්ත්වය හා කාර්යසාධනය නගා සිටුවීමට උත්සාහ දරණ ලදි. 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා ඒ හරහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන ලදි. ජනාධිපති කාර්යසාධන බලකාය මඟින් මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුග්‍රහය ලබා දුනි. 1997 හා 1999 දී සිදු වූ විෂය මාලා සංශෝධන අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට හේතු විය. ක්‍රියාකාරකම් පාදක ඉගැන්වීම, අත්‍යාවශ්‍ය ඉගෙනුම් හැකියා හඳුනා ගැනීම, ඉංග්‍රීසි අධ්‍යාපනයට වැඩි අනුබලයක් දීම ආදිය මෙවැනි සංශෝධන කිහිපයකි. 2003 දී මහාචාර්ය ආර්. පී. ගුණවර්ධන මැතිතුමන්ගේ සභාපතිත්වයෙන් ජාතික අධ්‍යාපන කොමිසම විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියකට මූලික වන වැදගත් යෝජනා මාලාවක් ඉදිරිපත් කරන ලදි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙවැනි ජයග්‍රහණ ලබාගෙන තිබුණ ද, අනිවාර්ය අධ්‍යාපනයේ යෙදෙන්නන් 83%ක් පමණ වීම, තියුණු පාසල් විෂමතාවය, ජනප්‍රිය පාසල් සඳහා තරඟය, අත්‍යාවශ්‍ය සම්පත් හිඟය, අධ්‍යාපන සේවාවන්හී නියුක්තීන්ගේ විවිධ වෘත්තික ප්‍රශ්න, සම්පිණ්ඩිත විභාග මුල් කර ගත් ඇගයීම් ක්‍රමයේ දුර්වලතා, අන්තර්කරණයේ හා උපදේශන සේවාවන්ගේ හීනතාවය, තෘතීය අධ්‍යාපන සීමා ආදී ගැටලු නිසා මෙරට අධ්‍යාපනයෙහි තත්ත්වය ගැන තෘප්තිමත් විය නොහැකි ය.

ඉන්පසුව හිටපු අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් ආචාර්ය පී. බී. ගුණවර්ධන මැතිතුමන්ගේ සභාපතිත්වයෙන් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමට ජාතික කමිටුවක් පත් කරන ලදි. එහි කමිටු වාර්තාව 2009 දී ප්‍රකාශයට පත් කරන ලදි. හත්වන

පාර්ලිමේන්තුවේ පළමුවන සැසිවාරයේ දී; 2010 ජූනි මස 23 වැනි දින අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් රැස් වූ පාර්ලිමේන්තුවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ; පළමුවන රැස්වීමේ දී, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යෝජනා සහ ඉහත දක්වූ ආචාර්ය පී. බී. ගුණවර්ධන කමිටුව ඉදිරිපත් කළ යෝජනා ද, අනෙකුත් බහුතර ජනතාවගේ අදහස් හා යෝජනාද පදනම් කරගෙන විශේෂ අධ්‍යාපන උපදේශක කාරක සභාවක් හරහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ නීති කෙටුම්පත් සකස් කළ යුතු බවට යෝජනාවක් සම්මත කරන ලදි. ඉන්පසුව විවිධ මහජන සංවිධාන, ගුරුවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ආදී ශිෂ්‍ය සංගම් හා අධ්‍යාපනයට සම්බන්ධ විවිධ පාර්ශව වලින් ඉදිරිපත් වූ යෝජනා මෙකී විශේෂ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් වාර 25 කදී; ආචාර්ය පී. බී. ගුණවර්ධන යෝජනාමාලාව පදනම් කරගෙන සාකච්ඡා කරන ලදි. ඒ සාකච්ඡාවල දී ඉදිරිපත් වූ යෝජනා හා ආචාර්ය පී. බී. ගුණවර්ධන කමිටු වාර්තාවේ සඳහන් කරුණු ඇසුරින් එකී පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් දක්වා ඇති යෝජනා මාලාව පිළිබඳව මූලික වාර්තාවක් නැවත සකස් කරන ලදි. අනතුරුව වාර ගණනාවක් රැස් වූ විශේෂ කාරක සභාව එම මූලික වාර්තාව නැවත විශ්ලේෂණය කර සංශෝධනය කරන ලදි. එම සංශෝධිත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

## සාමාන්‍ය අධ්‍යාපනය පාලනය සඳහා ඇති අණ පනත් හා නීති

1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත; 1939 අංක 61, 1946 අංක 3, 1947 අංක 27, 1951 අංක 5, 1958 අංක 37, 1973 අංක 35 යන පනත් වලින් සංශෝධනය වී ඇත. ආධාර ලබන පාසල් හා ගුරු විද්‍යාල පනත, 1960 අංක 5, 1961 අංක 8, 1981 අංක 65 යන පනත ද, 1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනත, 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත, 1985 අංක 28 දරණ ජාතික අධ්‍යාපන ආයතන පනත, 1986 අධ්‍යාපන විද්‍යායතන පනත හා 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ආදිය මෙරට අධ්‍යාපනය පාලනය කළ දේශීය අණ පනත් වේ. මීට අමතරව සමහර අන්තර්ජාතික හා ගෝලීය ප්‍රකාශන හා ප්‍රඥාප්තිවලින් ද මෙරට අධ්‍යාපනය හැඩ ගැස්වී ඇත.

# 1 අරමුණු හා මාර්ගෝපදේශ මූලධර්ම

අධ්‍යාපනයේ අරමුණ සමස්ථ පුද්ගල සංවර්ධනය තුළින් සමාජ සංවර්ධනය තහවුරු කිරීම වේ. රටක ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේ දී එක් එක් පුද්ගල අභිවෘද්ධිය, විවිධ සමාජ කණ්ඩායම් ඇතුළුව සමස්ථ සමාජය විසින් ඉෂ්ඨ සිද්ධ කර ගැනීමට අපේක්ෂා කරන ජාතික අරමුණු මුදුන් පමුණුවා ගත හැකි විය යුතු ය. සංවර්ධනය යන සංකල්පය ඒක දිසාතනික සංසිද්ධියක් නොව බහුවිධමාන හා සමෝධානිත වූවකි. එසේම එය භෞතික, බුද්ධිමය, සංස්කෘතික, සදාචාරාත්මක මෙන් ම ධනාත්මක සංරචක ආවරණය කෙරෙන සුළුවිය යුතු ය. එබැවින් සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ප්‍රතිපත්තිය සැකසීමේ දී පුද්ගලයන්ගේ සමෝධානිත සංවර්ධනය කේන්ද්‍රිත විය යුතු ය. පෙර පාසල් අවධියේ සිටම දරුවන්ගේ විභව්‍ය ශක්ති හඳුනාගෙන යෝග්‍ය නිෂ්ඨාවන් ඔස්සේ ඒවා උපරිමය කරා සංවර්ධනය කළ හැකි පරිදි ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රතිපත්ති සැකසිය යුතු වේ. අධ්‍යාපනය තුළින් දරුවන්ගේ මානසික හා කායික වර්ධනය උපරිම මට්ටමට පත් කරමින් සමස්ථ පෞරුෂ සංවර්ධනයට තුඩු දෙන පරිදි කාර්ය පටිපාටියක් සැකසීම අනිවාර්ය අවශ්‍යතාවකි.

සාමාන්‍ය අධ්‍යාපනය පුද්ගලයාගේ සාමාන්‍ය ජීවිතය ඵලදායී ලෙස ගත කිරීමට, සාර්ථක ලෙස එදිනෙදා ක්‍රියාකාරකම්වල නිරතවීමේ ශක්තිය ලබා දෙමින් පුද්ගලයාගේ යහපත් සෞඛ්‍ය ස්ථාවරත්වය තුළින් සමාජ ස්ථාවරත්වය තහවුරු කෙරෙන පරිදි සමස්ථ වශයෙන් පෘථුල වූ යථා දර්ශනයක් තුළ විෂය මූලික වශයෙන් කරුණු දැකීමටත්, ප්‍රාදේශීය, ජාතික හා අන්තර්ජාතික වශයෙන් නව අත්දැකීම් හුවමාරු කර ගැනීමට අනුබල දෙන සංවේදීයත්වයක් වර්ධනයට සමත් වූවක් විය යුතු ය. එසේම ජාතික ඒකාබද්ධතාව සහ ජාතික සමෝධානය තුළින් ශ්‍රී ලාංකික අනන්‍යතාව ප්‍රතිෂ්ඨාපනය කරමින් ජාතික සමඟිය හරහා ගොඩ නැගෙන "ශ්‍රී ලාංකීය" ජාතික සංවර්ධනය එහි මූලික ඉලක්කය විය යුතු ය.

දේශයේ පාරම්පරික උරුමයෙන් ලද ආගමික, සංස්කෘතික සාරධර්ම මත වූ හැදියාව තවදුරටත් ඔප මට්ටම් කර ගනිමින් අධ්‍යාපනය තුළින් නව සමාජයට ඔබින සහයෝගීතාව, පරහිතකාමීත්වය හා මානව දයාව පෙරටු කොටගත් ගුණගරුක සාරධර්ම පද්ධතියක් පවත්වාගෙන යා යුතු වේ. මෙම ප්‍රකාරණය තුළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ සාමාන්‍ය අධ්‍යාපනය තුළ ඉටුවිය යුතුපොදු අරමුණු පද්ධතියක් සඳහා යෝජනා දැක්වෙන අතර සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියම එකී අරමුණු ඉෂ්ඨ සිද්ධ කර ගැනීමෙහි ලා ඇපකැප වීම අපේක්ෂා කෙරේ.

## 1.1 ජාතික පොදු අරමුණු

1. මවුබිම වෙනුවෙන් කැප වී ජාතික, ආගමික හා සංස්කෘතික හර පද්ධතීන් හා උරුමයන් ආරාක්ෂා කරන ආත්ම අභිමානයෙන් යුත් පුරවැසියෙකු බිහි කිරීම.

2. ආගමික හා වාර්ගික විවිධත්වය පිළිගන්නා, ජාතික සමඟිය, ඒකාග්‍රතාවය හා සංහිඳියාව අගයන මානව සාරධර්ම වලින් පිරිපුන් පුරවැසියෙකු බිහි කිරීම.

3. වෙනස්වීම් වලට ඔරොත්තු දෙන පූර්ණ, තෘප්තිමත්, සමබර, නිදහස්, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු බිහි කිරීම.

4. පුද්ගල හා ජාතික ආර්ථිකයෙහි සංවර්ධනයට ඵලදායීව හා කාර්යක්ෂමව දායක විය හැකි දැනුම්, කුසලතා හා ආකල්ප වලින් පිරි විද්‍යාත්මක චින්තනයෙන් යුත් නිර්මාණශීලී බුද්ධිමතුන්, ව්‍යවසායකයන්, නායකයන් හා ශ්‍රම දායකයන් බිහි කිරීම.

5. පුද්ගලයෙකු සතු පූර්ණ විභව ශක්තිය විකසිත කිරීම හරහා විවිධ ක්ෂේත්‍රවල නව නිපැයුම් සිදු කරන යුග පුරුෂයන් බිහි කිරීම.

6. නව නිදහස් ගෝලීය සමාජයක තරඟකාරී ස්ථානයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය නූතන විද්‍යාත්මක දැනුම පෝෂණය කිරීම.

## 1.2 මාර්ගෝපදේශ මූලධර්ම

1. අයවැයෙන් වෙන් කෙරෙන සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වාර්ෂික පිරිවැය දළදේශීය නිෂ්පාදිතයෙන් 5% ක් දක්වා වර්ධනය කිරීමට උපරිම උත්සාහය දැරිය යුතු ය. එකී සම්පත් සමසේ, සාධාරණව, ප්‍රමාණවත්ව හා ඵලදායී ලෙස බෙදී යා යුතු ය.

2. ගුණාත්මක හා සමබර අධ්‍යාපනයක් ලැබීම සඳහා සෑම දරුවෙකුටම සාධාරණ අවස්ථා සැපයීම රජයේ වගකීම වේ.

3. පෙර පාසල් අධ්‍යාපනය මධ්‍යම අධිකාරියකින් නියාමනය විය යුතු ය.

4. වයස අවුරුදු 5-16 දක්වා අධ්‍යාපනය අනිවාර්යය විය යුතු ය.

5. සෑම දරුවෙකුගේම නිදහස් අධ්‍යාපන අවස්ථා තහවුරු කරමින් සුරැකීම රජයේ වගකීම වේ.

6. ඉහත කී අනිවාර්යය හා නිදහස් අධ්‍යාපනය හදිසි හා ආපදා අවස්ථා යටතේ වුවද සහතික කළ යුතු ය.

7. අතිශය බහුතර ශ්‍රී ලාංකික දරුවන්ගේ මවුබස හා ජාතික භාෂා සිංහල හෝ දෙමළ වේ. එකී මවුබස පදනම් කර ගත් ත්‍රිභාෂා අධ්‍යාපන අවස්ථා සහතික කළ යුතු ය. මවුබස තීරණය කිරීම දෙමාපිය අයිතියක් වේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්විය හැකි ය.

8. පාසල තුළ තම ආගම හැදෑරීමට හා පිළිපැදීමට පිළිගත් ආගම්වල දරුවන්ට අයිතිය තිබිය යුතු ය.

9. පාසලේ කොඳු නාරටිය ලෙස අදාළ නායකත්ව ගුණ, පෞරුෂය, නැණ ගුණ හා සුදුසුකම් ඇති විදුහල්පතිවරුන් පත් කොට යාවත්කාලීන කොට සංවර්ධනය කරමින් පවත්වා ගත යුතු ය.

10. සුදුසුකම් සහිත, දැනුමැති, දක්ෂ, කාර්යක්ෂම, සමාජයට වග වන, යහපත්, ආදර්ශමත් හා උපාධිධාරී ගුරු පරපුරක් බිහි කොට සංවර්ධනය කරමින් පවත්වා ගත යුතු ය.

11. අධ්‍යාපන වෘත්තීයේ, වෘත්තීයභාවය හෙවත් ගුණාත්මක තත්ත්වය, ස්වාධීනත්වය හා ගෞරවය සහතික කළ යුතු වේ.

12. ගෝලීය ප්‍රවණතාවයන්ට අනුව විෂය නිර්දේශ, ඉගැනුම් පටිපාටිය, කාලසටහන් ආදිය සෑම වසර 5 කට වතාවක් ම යාවත්කාලීන කරමින්, ඒ සඳහා ගුරුවරු පුහුණු කළ යුතු ය.

13. සෑම දරුවෙකුටම සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ලබා දිය යුතු ය. ඊට අමතරව විෂය සමගාමී ක්‍රියාකාරකමක හෝ ක්‍රීඩාවක යෙදීම අනිවාර්ය විය යුතු ය. තවද ඒ සඳහා පහසුකම් සැළසිය යුතු ය.

14. විෂය මාලාව ඉගැන්වීම, විෂය සමගාමී ක්‍රියාකාරාකම්, ක්‍රීඩා ආදිය ගුණාත්මකවත්, ප්‍රමිතියටත් පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් හා ඉගෙනුම් ආධාරක හා උපකරණ ඇතුළු අනෙකුත් පහසුකම් සැමට සාධාරණ ලෙස ලබා දීම රජයේ වගකීමක් වේ.

15. අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලැබිය යුතු ය. මේ ක්‍රියාවලිය ලියාපදිංචි කිරීම් හරහා නිවැරදි පරිපාලනයක්, තත්ත්ව පාලනයක් හා නියාමනයක් යටතේ සිදුවිය යුතු ය.

16. සෑම වැඩිහිටියෙකුම ගුරුවරයෙකි. ආදර්ශමත් වැඩිහිටි පරපුරක් හරහා ඉපදුනු හා ඉපදෙන්නට සිටින දරුවන් නිවැරදි අධ්‍යාපන මාර්ගයකට ගෙන ඒමටත්, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුත් පරපුරක් ගොඩනැගීමටත්, එකී වැඩිහිටියන් දැනුවත් කිරීමට හා පුහුණු කිරීමට අධ්‍යාපනය සඳහා කැප වූ ජාතික රූපවාහිනී නාලිකාවක් ඇති කළ යුතු ය. එවැනි රූපවාහිනී නාලිකාවක්, පාසල් දරුවන්ට දුරස්ථ අධ්‍යාපනය ලබා දීමටත්, ගුරුවරුන්ට හා සමස්ථ අධ්‍යාපන පද්ධතියට අත්වැලක් ලෙසත් භාවිත කළ යුතු ය.

17. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම තෝරා ගත් පාසල් එකක වත් විශේෂ අවශ්‍යතා හා ඉගෙනුම් ඌනතා ඇති දරුවන් සඳහා අන්තර්කරණ පාඨමාලා ඇති කොට සම්පත් කාමර ද ආරම්භ කළ යුතු ය. අන්තර්කරණ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා එම පාසල්වල ගුරුවරුන් පුහුණු කළ යුතු අතර සමාජ සංවර්ධනයට අදාළ පාඩම් සිදු කරන කාලපරිච්ඡේද තුළ දී විශේෂ අවශ්‍යතා ඇති දරුවන් අධීක්ෂණයක් සහිතව සාමාන්‍ය දරුවන් සමඟ තැබිය යුතු ය.

18. දරුවකු නව යෞවන වියට පා තැබීමත් සමඟ ම ඇතිවන ශාරීරික හා මානසික විචල්‍යතාව නිසා පැන නගින චිත්ත වේග පාලනය කිරීමට ඔවුන් පුහුණු කර මඟ පෙන්වනු වස්, සෑම පාසලකම ගුරුවරු කිහිප දෙනෙකුවත් මනෝවිද්‍යාත්මක උපදේශකවරු ලෙස පුහුණු කළ යුතු ය. පාරිසරික හා පවුල් ප්‍රශ්න නිසා බැට කා අසහනයට හා විශාදයට පත් වූ දරුවන් සඳහා ද මේ මනෝ විද්‍යාත්මක උපදේශන සේවා අත්‍යාවශ්‍ය වේ.

19. සෑම පාසලක්ම ආවරණය වන පරිදි සුදුසුකම් ඇති මනෝ විද්‍යාත්මක උපදේශන සේවා සැපයිය යුතු ය.

20. දරුවෙකු 9 වැනි ශ්‍රේණියට පැමිණෙන විට පළාතේ හා රටේ ස්වාභාවික සම්පත් ආශ්‍රිතවත්, ලෝකයේ නව ප්‍රවණතාවයක් සම්බන්ධවත්, දරුවාගේ සහජ විභව්‍යතා හා බුද්ධීන්ට අනුකූලවත් දරුවාගේ අනාගත වෘත්තීය පිළිබඳ ඉලක්ක තෝරා ගැනීමට හැකිවන පරිදි මඟ පෙන්වීම් වස් එකී වයසේ දරුවන්ට වෘත්තීය උපදේශන ලබා දිය හැකි වෘත්තීය උපදේශකයන් පුහුණු කොට සැපයිය යුතු ය.

21. ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන සියලු දරුවන් තෘතීය අධ්‍යාපනයක් හරහා වෘත්තීය පුහුණුවකට හා වෘත්තීයකටත්, උපාධියකටත් යොමු වන තෙක් ඔවුන් අභිප්‍රේරණය කොට මඟ පෙන්වීමට අවශ්‍ය සියලු පහසුකම් හා ඉඩකඩ සැලසීම අධ්‍යාපනය පිළිබඳ ජාතික වගකීමයි.

22. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු ලැබෙන ප්‍රතිඵල අනුව දරුවන් සුදුසු පරිදි උසස් පෙළ අධ්‍යාපනයට හෝ පාසල් පාදක වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවලට බෙදා ඇතුළු කළ යුතු ය.

23. පාසල්වල යටිතල පහසුකම් භාවිතා කරමින්, පස්වරුවේ හෝ සති අන්තවල පවත්වන වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවලට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය හා සහයෝගය ලබා ගත යුතු ය. පුහුණුවෙන් පසු එකී දරුවන් නිපුණතා උපාධියක් දක්වා සංවර්ධනය කිරීම එම අමාත්‍යාංශයේ වගකීම වේ.

24. උසස් පෙළ විභාගයෙන් පසු දරුවන් සුදුසු පරිදි විශ්ව විද්‍යාල අධ්‍යාපනයට, වෙනත් තෘතීය අධ්‍යාපනයකට හෝ පාසල් පාදක වෘත්තීය පාඨමාලාවලට අනුයුක්ත කළ යුතු ය.

25. පාසලේ සුළු නඩත්තු කටයුතු, කළමනාකරණය, පවිත්‍රතාවය, සංවිධානය, ක්‍රමවත්බව, ගුරුවරු හා සේවකයන්, මුදල් පරිපාලනය, සාමාන්‍ය පරිපාලනය, ආදිය පිළිබඳ කටයුතු පාසල් මට්ටමෙන් කර ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයට, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට වග වන පාසල් සංවර්ධන සමිති [School Development Society] ඇති කොට පාසල්වලට යම් ස්වාධීනත්වයක් ලබා දිය යුතු ය.

26. ජාතික විෂය මාලාව සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම හා සහතිකකරණය හා ඇගයීම, මධ්‍යම රජයේ වගකීම් වේ. සිසු ඇගයීම හා සහතිකකරණය සම්භවන හා සම්පිණ්ඩන ක්‍රම අනුව සිදු විය යුතු අතර, මේ ක්‍රියාවලි ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

# 2

## අධ්‍යාපන පද්ධතිය - ව්‍යුහය සහ කාර්යභාරය

අධ්‍යාපන පද්ධතියේ ව්‍යුහය හා කාර්යභාරය අද වෙනදාට වඩා සංකීර්ණ, කාර්ය බහුල එමෙන්ම දේශපාලන හා රාජ්‍ය පරිපාලනමය අවශ්‍යතා මත, මහජන උපයෝගීතාව පෙරටුකොටගත්, තරඟකාරී ස්වාභාවයකින් ද සංයුක්ත වී පවතින බව අමුතුවෙන් කිවයුතු නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මධ්‍යම රජයේ අධිකාරයක්ව පැවති අධ්‍යාපනය ලබා දීමේ වගකීම හා අයිතිය පළාත් සභා පාලනය කරා ද විතැන් වී පවතින අතර පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම ද රාජ්‍ය උපාය මාර්ගයක් බවට පත් වී ඇත.

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ එතෙක් මධ්‍යම රජය විසින් බුක්ති විඳින ලද යම් යම් බලතල හා රාජකාරී වගකීම් පළාත් සභා වලට විමධ්‍යගත කිරීමත් සමඟම ඇතැම් විට පෙනීගිය, අසන්නට ලැබුණු කළමනාකරණ සංකීර්ණතා මැනවින් පාලනය කර ගනිමින් සරල සුගම ලෙස හසුරුවා ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණයේ කිසියම් ප්‍රතිව්‍යුහකරණයක් අවශ්‍ය බව පෙනී ගිය කරුණකි. මෙම ප්‍රකාරණය තුළ රාජ්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයෙන්ම මැදිහත් විය යුතු පරිපාලන ඒකක දම්වැලක පුරුක් මෙන් එකට අමුණා අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබන පෙර පාසල් දරුවා දක්වා විහිද යන පරිදි කළමනාකරණ සන්දර්භයක් සකස් කළ යුතුව පවතී.

ජනාධිපතිවරයාට අධ්‍යාපනය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා එතුමා විසින් පත් කරනු ලබන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, මධ්‍යම රජයේ අධ්‍යපාන අමාත්‍යාංශය, අධ්‍යාපන කවුන්සිලය, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික්ක අධ්‍යාපන කාර්යාලය, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, යනාදී වශයෙන් පාසල දක්වා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය, අධීක්ෂණය, ඇගයීම හා තත්ත්ව පාලනය සම්බන්ධ කළමනාකරණය, යථා යෝග්‍ය පරිදි පවත්වා ගෙන යෑම සඳහා මතු දැක්වෙන යෝජනා ඉදිරිපත් කරමු.

## 2.1 මධ්‍යම අධිකාරිය

2.1.1 අධ්‍යාපන සංවර්ධන, පරිපාලන හා කළමනාකරණ ව්‍යුහය පහත දැක්වෙන පරිදි විය යුතු ය.



2.1.2 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය, අධීක්ෂණය, ඇගයීම, තත්ත්ව පාලනය, ජාතික මට්ටමේ සේවක කළමනාකරණය ආදිය අධ්‍යාපන අමාත්‍යාංශයේ [MOE] කාර්ය භාරයයි. මේ සඳහා උපදෙස් වශයෙන් රේඛීය අමාත්‍යාංශ හා පළාත් අමාත්‍යාංශ නිලධාරීන්ට නිකුත් කෙරෙන සියලු චක්‍රලේඛන සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම විය යුතු ය.

2.1.3 සාමාන්‍ය අධ්‍යාපනයට සහභාගී වන සියලු ආකාරවල පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් නිර්දේශ කරනු ලබන අවම තත්ත්වයන්ට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචියට, නියාමනයට, අධීක්ෂණයට හා ප්‍රමිතිකරණයට යටත් විය යුතු ය.

2.1.4 ජාතික අධ්‍යාපන ආයතනයේ [NIE] කාර්යභාරය ඉතා පැහැදිලිව අර්ථකථනය කළ යුතු ය. සාමාන්‍ය අධ්‍යාපනයේ සියලු අංශ සඳහා විෂය මාලා සංවර්ධනය, ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවර්ධනය පිණිස භෞතික සම්පත් නිර්මාණය කිරීම, නිපදවීම හා උපදෙස් දීම, විදුහල්පති හා ගුරු පුහුණුව, අධ්‍යාපන ගුරු උපාධි ලබා දීමේ වගකීම, ගුරු වෘත්තීය යාවත්කාලීන කිරීම, අධ්‍යාපන රූපවාහිනී නාලිකා පවත්වාගෙන යාම, පූර්ව ළමා විය සංවර්ධනය හා සුරැකුම පිළිබඳ නියාමනය ආදිය ඊට අයත් විය යුතු ය. (1985 අංක 28 දරණ ජාතික අධ්‍යාපන ආයතන පනත)

2.1.5 අධ්‍යාපන සේවාවන්හි යෙදෙන්නන්, වෘත්තිකයන් බවට පත් කිරීමට පහත දැක්වෙන කාර්ය භාරයෙන් හා බලතල වලින් යුතු ස්වාධීන අධ්‍යාපන කවුන්සිලයක් [EC] ස්ථාපනය කළ යුතු ය.

## අධ්‍යාපන කවුන්සිලයේ කාර්යභාරය

- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව අධ්‍යාපන වෘත්තියේ නියැලීම සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තීරණය කිරීම.

- අධ්‍යාපන වෘත්තීයවේදීන් ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම හා එම වෘත්තීයවේදීන්ගේ ලේඛනයක් අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

- ලියාපදිංචි අධ්‍යාපන වෘත්තීයවේදීන්ට බලපාන ආචාර ධර්ම මාලාවක් පවත්වාගෙන යාම .

- ලියාපදිංචි අධ්‍යාපන වෘත්තීයවේදීන්ට එරෙහිව ඉදිරිපත්වන චෝදනා විභාග කිරීම සහ අධ්‍යාපන වෘත්තීයට නොගැලපෙන අයුරින් කටයුතු කරන තැනැත්තන් පිළිබඳව නිසි පියවර ගැනීම. (ලියාපදිංචි වෘත්තීය ලැයිස්තුවෙන් නම ඉවත් කිරීම)

- අධ්‍යාපන වෘත්තියෙහි නියැලීමට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පිරිනමන විශ්ව විද්‍යාල හෝ එවැනි වෙනත් ආයතන තක්සේරු කිරීම හා පිළිගැනීම හා නියමිත ප්‍රමිතිවලට අනුව පවත්වා ගෙන නොයන අධ්‍යාපන ආයතන වසා දැමීම හෝ පිළිනොගැනීම සඳහා අදාළ ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීම.

- සුදුසුකම් නොලත් තැනැත්තන් අධ්‍යාපන වෘත්තියෙහි නියැලීම වැළැක්වීමට පියවර ගැනීම.

- අධ්‍යාපන වෘත්තියට අදාළ කාරණාවලදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට සහ ජාතික අධ්‍යාපන ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා අධ්‍යාපන අමාත්‍යාංශයට උපදෙස් දීම.

## අධ්‍යාපන කවුන්සිලයේ සංයුතිය

- සභාපති (අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විශිෂ්ඨ අධ්‍යාපනඥයෙක්).
- විශ්ව විද්‍යාල අධ්‍යාපන පීඨ ආචාර්යවරුන් අතරින් පත් කරනු ලබන නියෝජිතයෙක්.
- ගුරු අධ්‍යාපනඥයින් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙක්.
- අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙක්.
- විදුහල්පති සේවයේ නිලධාරීන් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙක්.
- ගුරු සේවයේ නිලධාරීන් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙක්.
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශ මත අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විශ්‍රාමික විශිෂ්ඨ අධ්‍යාපනඥයින් තිදෙනෙක්.

2.1.6 1968 අංක 25 දරණ විභාග පනත සංශෝධනය කළ යුතු ය. විභාග දෙපාර්තමේන්තුව [ED] විශ්වාසනීයත්වය , රහස්‍යභාවය, වලංගුභාවය, ප්‍රමිතිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරගෙන පාසල් පද්ධතියේ ජාතික මට්ටමේ ඇගයීම් ද රජයේ උසස් කිරීම්, බඳවා ගැනීම් හා කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ ඇගයීම් ද සිදු කර ප්‍රතිඵල හා සහතිකයන් නිකුත් කිරීම් හා ප්‍රසිද්ධ කිරීම සිදු කළ යුතු ය.

2.1.7 ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව පාසල් පද්ධතිවල පවත්වන ඇගයීම් හා තක්සේරු ක්‍රම අධීක්ෂණය, නියාමනය හා උපදෙස් දීම ද, ජාත්‍යන්තර මට්ටමේ ඇගයීම් ක්‍රම සොයා බලා සුදුසු ක්‍රම හඳුන්වා දීම ද විභාග දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. තවද සා.පෙළ හා උ.පෙළ ප්‍රතිඵලවලින් වාර්ෂිකව සකස් කරන පාසල් සාධන දර්ශක හරහා පාසල්වල ඵලදායීතාවය ඇස්තමේන්තු කොට පාසල් පද්ධතිය අභිප්‍රේරණය කිරීමට එය යොදවා ගත යුතු ය.

2.1.8 ජාතික අධ්‍යාපන ආයතනය හා ඒකාබද්ධව පාසල් පාදක ඇගයීම් ; ජාතික මට්ටමේ විභාග පාදක ඇගයීම් සමඟ ඒකාබද්ධ කළ හැකි ක්‍රම වේද හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම විභාග දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

2.1.9 ජාතික මට්ටමේ විභාග වලදී ඉංග්‍රීසි භාෂාව සඳහා ඇහුම්කන් දීමේ හා කතා කිරීමේ කුසලතාවයන් ප්‍රායෝගිකව තක්සේරු කළ හැකි සුදුසු ක්‍රමවේදයන් හඳුනාගෙන ඒ සඳහා ලකුණු ප්‍රමාණයක් ලබා දිය යුතු ය.

2.1.10 විභාග දෙපාර්තමේන්තුව විසින් ජාතික මට්ටමේ විභාග පවත්වන කාල වකවානු නැවත සමාලෝචනය කළ යුතු අතර, ඕනෑම විභාගයක ප්‍රතිඵල සති 10කට අඩු කාලයක දී ද, නැවත සමීක්ෂණ කටයුතු සති 8කට අඩු කාලයක දී ද නිම කොට ප්‍රතිඵල ඉදිරිපත් කළ යුතු ය.

2.1.11 ජාතික මට්ටමේ විභාග පැවැත්වීමේ දී ශිෂ්‍යයන් අනවශ්‍ය පීඩනයකට ලක් නොවන පරිදි අදාළ ක්‍රම වේදයන් සකස් කර ගැනීම විභාග දෙපාර්තමේන්තුවේ වගකීමකි.

2.1.12 ජාතික අධ්‍යාපන ආයතනය නිර්දේශ කරන පාසල් පෙළපොත් හා වෙනත් ප්‍රකාශන ලිවීම, ඒවායේ නිරවද්‍යතාව, අදාළ බව, යාවත්කාලීන බව සහතික කිරීම, මුද්‍රණය කිරීම, තත්ත්වපාලනය හා ප්‍රමාදය වළක්වා සෑම පාසල් යන දරුවෙකුටම නොමිලේ බෙදා හැරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ [DOP] කාර්යභාරයයි.

2.1.13 මෙකී ප්‍රකාශන වෙනස් පිට කවර යටතේ මුද්‍රණය කොට අවශ්‍ය ඕනෑම කෙනෙකුට මිලදී ගැනීම සඳහා වාණිජ වෙළෙඳ පොළේ ද සුළභ කළ යුතුය.

2.1.14 රටට උවමනා සමස්ථ ගුරුවරු ප්‍රමාණය සංවර්ධනය කර ගැනීම පිණිස ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ඩිප්ලෝමා පාඨමාලා, වසර 4 ක උපාධියක් දක්වා උසස් කර, ඒ යටතේ සෑම ගුරුවරයෙකුටම ඉංග්‍රීසි, පරිඝනක, විශේෂ අධ්‍යාපනය, අන්තර්කරණය හා උපදේශනය අනිවාර්ය විෂයක් ලෙස ප්‍රගුණ කරවිය යුතුය. (1986 අංක 130 දරණ අධ්‍යාපන විද්‍යාපීඨ පනත)

## 2.2 පළාත් අධ්‍යාපන අධිකාරිය

2.2.1 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාත් අධ්‍යාපන අධිකාරියට විමධ්‍යගත කළ කාර්යභාරය 9 වන උප ලේඛණයේ 1 වන ලයිස්තුවේ III වන පරිශිෂ්ඨයෙහි දක්වා ඇත. ඒ අනුව පවරා ඇති ක්ෂේත්‍ර ආවරණය වන අධ්‍යාපන ප්‍රඥාප්ති හා ව්‍යවස්ථා සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම පළාත් අධ්‍යාපන අධිකාරියේ වගකීම යි.

2.2.2 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන කාර්යාලය ඒකාබද්ධව පළාතේ සියලු අධ්‍යාපන කටයුතු කළමනාකරණය කළ යුතු ය. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ එකඟත්වය ඇතිව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ සැළසුම් පළාත තුළ ක්‍රියාත්මක කිරීම පළාත් අධ්‍යාපන ලේකම්ගේ කාර්යභාරයයි.

2.2.3 පළාත් අධ්‍යාපන සංවිධාන ව්‍යුහය හා කාර්යයන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් මත තීරණය විය යුතු ය.

2.2.4 දැනට පවතින අධ්‍යාපන කලාප වෙනුවට දිස්ත්‍රික් අධ්‍යාපන කාර්යාල පිහිටුවිය යුතුය. කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සංවිධානය විය යුතුය.

2.2.5 දිස්ත්‍රික් අධ්‍යාපන කාර්යාල හරහා දිස්ත්‍රික් අධ්‍යාපන පරිපාලන හා මූල්‍ය කටයුතු සිදු විය යුතුය. මෙහි දී පාසල් පරිපාලනයට අදාළ සියලු චක්‍ර ලේඛන හා ලිපි සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම නිකුත් කළ යුතු ය.

2.2.6 අධ්‍යාපන කාර්යාලවල සියලු නිළධාරීන්ගේ කාර්යභාරය හා නිල බලතල ඉතා පැහැදිලිව නිර්වචනය කළ යුතු අතර, ඊට උරදීමට තරම් සුදුසුකම්, පුහුණුව හා පළපුරුද්ද ඇති නිළධාරීන් සරිලන ප්‍රමාණයක් සේවයෙහි යෙදිය යුතු ය.

2.2.7 පළාත් අධ්‍යාපන සංවිධානය ව්‍යුහය හරහා ක්‍රමයෙන් පාසලේ ස්වාධීනත්වය වැඩි කරමින්, පාසල් පාදක කළමනාකරණ හා සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ යුතු ය

## 2.3 ව්‍යවස්ථාපිත මණ්ඩල

2.3.1 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා ජාතික අධ්‍යාපන ආයතනය ව්‍යවස්ථාපිත අධ්‍යාපන ආයතන වේ. එකී ආයතන වලට ආවේණික අණ පනත් වල ඇති සියලු බලතල නැවත අර්ථකථනය කර, එම විධි විධාන කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම ඒවායේ කාර්යභාරය වේ.

## 2.4 පාසල් පද්ධතිය

2.4.1 පාසල යනු , අධ්‍යාපනයේ ජාතික පොදු අරමුණු කරා දරුවා ගෙන යන ආයතනයයි.

2.4.2 විවිධාකාරයෙන් පාසල වර්ගීකරණය කිරීම නතර කළ යුතු ය. පාසල් ව්‍යුහයේ පැවතිය යුත්තේ ප්‍රාථමික පාසල්, ද්විතීයික පාසල් යන වර්ග පමණි. පාසල් නිශ්චිත කාල රාමුවක් තුළ ක්‍රමානුකූලව මෙකී පරිවර්තනය කරා ගෙන යා යුතු ය.

2.4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 3 ක් වත් වන පරිදි උසස් පෙළ දක්වා සියලු විෂය ධාරා ක්‍රියාත්මක වන ද්විතීයික පාසල් පද්ධතියක් සංවර්ධනය කොට පවත්වා ගත යුතු ය. එකී එක් පාසලක් සඳහා පෝෂක ප්‍රාථමික පාසල් පහක් බැගින්වත් තිබිය යුතු ය. ප්‍රාථමික අදියර සම්පූර්ණ කරන සෑම ළමයෙකුටම අංග සම්පූර්ණ ද්විතීය පාසලක් ලැබීම සහතික කළ යුතු ය.

2.4.4 සියලුම පාසල්වල අධ්‍යාපනය නියමිත ගුණාත්මක තත්ත්වයන්ට ගෙන ඒම පිණිස අවශ්‍ය යාන්ත්‍රණයක් වහාම සකස් කළ යුතු ය. ඒ හරහා අධ්‍යාපනයේ සමානාත්මතාවය තහවුරු කළ යුතු ය.

2.4.5 කුඩා පාසල්වල දරුවන්ට ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීමට රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන වලින් උපරිම අනුග්‍රහය ලබා ගත යුතු ය.

2.4.6 නිර්දේශිත අවම තත්ත්වයක් ඇති සියලු පෞද්ගලික පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තත්ත්ව පාලනයක්, අධීක්ෂණයක් හා නියාමනයක් සිදු කළ යුතු ය. අධ්‍යාපන ධාරාවේ නව වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ සියලු චක්‍ර ලේඛන එම පාසල්වලට ලබා දිය යුතු ය.

2.4.7 ජාති, ආගම්, භේදවලින් තොර, එහෙත් එකී  අනන්‍යතාව රැකගෙන ඉදිරියට යා හැකි මිශ්‍ර පාසල් පද්ධතියක් ඇති කිරීම අධ්‍යාපනයේ  අනාගත වගකීමයි.

2.4.8 පංතියක සිටින උපරිම සිසුන් සංඛ්‍යාව ප්‍රාථමික පාසලක 35 ක් ද, ද්විතීයික පාසලක 40 ක් ද විය යුතු ය.

2.4.9 පන්තියක සිසු ගහණය අහඹු ලෙස මිශ්‍ර වී තිබිය යුතු ය.

2.4.10 1 වන ශ්‍රේණියට දරුවෙකු ඇතුලත් කිරීමේ මූලික නිර්ණායක විය යුත්තේ, පදිංචියේ සමීපතාවය හා වයසයි.

2.4.11 වසරක් තුළ පැවැත්වෙන අවම පාසල් දින සංඛ්‍යාව 210 ක් විය යුතු ය. අවම වශයෙන් දිනක දී ප්‍රාථමිකය සඳහා පැය 5ක් ද, ද්විතීයිකය සඳහා පැය 6ක් ද වශයෙන්  ඵලදායී ඉගැනුම් ඉගැන්වීම් කටයුතු සිදු විය යුතු ය.

## 2.5 අනිවාර්ය අධ්‍යාපනය

2.5.1 වයස අවුරුදු 5-16 දක්වා අධ්‍යාපනය අනිවාර්ය වේ. දෙමාපියන් විසින් දරුවන් පාසලට නොයැවීම නීතියෙන් දඬුවම් කළ හැකි වරදක් බවට පත් කළ යුතු ය.

2.5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ළමයි පාසල් යෑමේ ප්‍රවනතාව පරීක්ෂා කිරීමේ වගකීම සුදුසු ව්‍යවස්ථාපිත නිළධාරියෙකුට භාර කොට අදාළ වයස් කාණ්ඩයේ සියලු  දරුවන් පාසල් යාම සහතික කළ යුතු ය.

## 2.6 පෙර පාසල් අධ්‍යාපනය (මුල් ළමා විය සංවර්ධනය හා සුරැකුම).

2.6.1 මේ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන කොමිසමේ වගකීමයි. ඒ සඳහා වනිතා කටයුතු හා ළමා රක්ෂණ අමාත්‍යාංශයේත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේත් සහයෝගය ලබා ගත යුතු ය.

2.6.2 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ හා ප්‍රමිතිය රැක ගැනීමේ වගකීම ඉටු කළ යුතු ය. පෙර පාසල් ලියාපදිංචි කිරීම, නියාමනය හා අධීක්ෂණය පළාත් මඟින් පරිපාලනය විය යුතු ය.

## 2.7 අන්තර්කරණ අධ්‍යාපනය ; අවාසිදායී ළමයින්ගේ අධ්‍යාපනය

2.7.1 රැකවරණය අහිමි වූ දිළිඳු, විතැන් වූ, වතුවල, වීථිවල හා අනාථ ආදී වූ ළමයි සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී අධ්‍යාපන ධාරාවට ඔවුන් ඇතුළු කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රමවේදයක් ඇති කොට ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු ය.

2.7.2 ළමයි 50 ට අඩු හා අවාසිදායක පාසල් හඳුනාගෙන ඒවා සංවර්ධනය කොට ළමයි සංඛ්‍යාව වැඩි කර ගැනීමට සියලු කටයුතු සම්පාදනය කළ යුතු ය. මේ කටයුතු සඳහා පෞද්ගලික අංශවල සහයෝගය, සම්පත් දායකත්වය හා අනුග්‍රාහකත්වය ලබා ගත හැකි ය.

2.7.3 කුඩා, හුදකලා හා අවාසිදායක පාසල්වල සේවය සඳහා ගුරුවරු අනිවාර්යයෙන් අනුයුක්ත කළ හැකි සාධාරණ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු ය. එකී ගුරුවරු අදාළ ග්‍රාමීය ප්‍රදේශ මුල්කරගෙන පුහුණු කිරීම හා සුදුසු දිරි දීමනා ලබා දීමත් කළ යුතු ය.

2.7.4 ආබාධිත හා ඉගෙනුම් ඌනතා සහිත දරුවන් සඳහා අන්තර්කරණය දිරිමත් කළ යුතු ය. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් අවම වශයෙන් තෝරා ගත් ප්‍රාථමික පාසල් 3 කට හා ද්විතීයික පාසලකට අන්තර්කරණය හඳුන්වා දී ඔවුන්ගේ සංචරණය පහසු වන යටිතල පහසුකම්, සම්පත් කාමර හා විශේෂ පුහුණු ගුරුවරු සැපයිය යුතු ය.

2.7.5 අන්තර්කරණය ක්‍රියාවලිය යටතේ සාමාන්‍ය පාසල්වලට ඇතුළු කර ගත නොහැකි තරම් දැඩි ලෙස ආබාධිත දරුවන්ගේ විශේෂ අවශ්‍යතා සපුරනු වස්, සෑම දිස්ත්‍රික්කයකම එක විශේෂ පාසලක් බැගින්, පිහිටුවිය යුතු ය. අවශ්‍ය විටෙක ඒවායේ නේවාසික පහසුකම් සැපයිය යුතු ය.

2.7.6 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලා උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කිරීමේ දී, සෑම ගුරුවරයෙකුටම විශේෂ දරුවන් හා අන්තර්කරණය හා උපදේශනය පිළිබඳව අනිවාර්ය හය මාසික විෂය මාලාවක් ඇතුළු කොට සියලු ගුරුවරුන්ට මේ පිළිබඳ අවබෝධයක්, පුහුණුවක් හා සුභවාදී ආකල්ප ලබා දිය යුතු ය.

# 3 අධ්‍යාපන පද්ධතිය - අන්තර්ගතය හා ක්‍රියාවලිය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල විධිමත් හා අවිධිමත් අත්දැකීම් මඟින් පෝෂණය ලබමින් පාසලේ සංවිධානයට, සැලසුම්කරණයට හා ක්‍රියාත්මක කිරීමට යටත්වන සියලු ම ව්‍යුහගත ඉගෙනුම් අත්දැකීම් පාසල් විෂය මාලාවට අයත් වෙයි. මෙලෙස ජාතික මට්ටමෙන් සකස්කොට පාසලට හඳුන්වා දෙනු ලබන විෂය මාලාව තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක බව විශාල වශයෙන් වැඩි දියුණු කිරීම අපේක්ෂා කළ යුතු ය. එසේම ගෝලීයකරණය හා දැනුම ආර්ථිකය තුළ සිදුවෙමින් පවත්නා සියලු වෙනස්කම් හමුවේ උදාවන තත්ත්වයන්ට මුහුණ දෙමින් සිය අනාගතය ගොඩ නංවා ගැනීමට උපරිම දායකත්වයක් ලබා දිය හැකි පරිදි පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය බෙහෙවින් නවීකරණයට බඳුන් විය යුතු ය.

ඉගැන්වීමේ මාධ්‍යය පිළිබඳ සැබවින්ම පවතින ගැටලු පැහැදිලිව නිරාකරණය කරගත යුතු වේ. ජාතික ඒකාග්‍රතාව ඉතා ඉහලින් අවශ්‍ය මෙවන් යුගයක ඉගැන්වීමේ භාෂා මාධ්‍යය භාවිතය ඊට අතිමහත් ශක්තියක් විය යුතු ය. විෂය මාලාව බෙදා හැරීමටත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනාකොට ශක්තිමත් කිරීමටත් දායක විය හැකි ගුණාත්මක වශයෙන් මෙන්ම ආකර්ශනීය වශයෙන් ද දරුවන්ට සිත් අලවන පරිදි මවුබස හා ජාතික භාෂාවලින් පෙළපොත් නිපදවා කලට වේලාවට නොමිලේ නියමිත පරිදි දරුවන් අතට පත් කිරීම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ ප්‍රබලතම අවශ්‍යතාවයකි. පාසල්පාදක ඇගයීම් ගුණාත්මක ලෙස සංවර්ධනය කරමින් සම්භවන හා සම්පිණ්ඩිත යන දෙආකාරයෙන්ම දරුවන් ලබන ඉගෙනුම තක්සේරුවට හා ඇගයුමට බඳුන් කළ යුතුව පවතී. ඊට සමගාමී අවශ්‍යතාවක් වන දරුවන්ගේ ඉගෙනුමට නිසිමඟ පෙන්වා දීම හා උපදේශනයන්ද, අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා දෙමාපිය දායකත්වය, සාරධර්ම අධ්‍යාපනය ද යන ප්‍රකාරණයන් යාවත්කාලීනව සංවර්ධනය වන පරිදි විධි ක්‍රම හා උපාය මාර්ග සැලසුම් කළ යුතු ය.

එසේම නූතන ලෝකයේ අධ්‍යාපනය ලබා දීම සඳහා දියුණු රටවල යොදා ගන්නා වූ තාක්ෂණික ක්‍රමවේද, අන්තර්ජාලය, රූපවාහිනිය, ගුවන් විදුලිය ඇතුළු බහු මාධ්‍ය සන්නිවේදනය කුමන ආකාරයෙන් හා කවර අනුපාතයෙන් පාසල තුළට වැද්දගත යුතු ද යන්න මෙහිලා තීරණය කළ යුතු වේ. මෙම සියලු තත්ත්වයන් හා ඉදිරි ගමන හමුවේ පවතින දුෂ්කරතා ගැටලු ජය ගැනීමට නම් අනිවාර්යෙන්ම පාසලේ දෛනික ඉගෙනුම් පරිසරය ප්‍රමාණාත්මක වශයෙන් මෙන්ම ගුණාත්මක වශයෙන් ද වැඩි දියුණු හා අංග සම්පූර්ණ කිරීම සඳහා පාසල් නඩත්තුව හා යටිතල පහසුකම් ප්‍රවර්ධනය කළ යුතුව පවතී. මෙම අවශ්‍යතා සමනය කිරීම සඳහා මෙම ප්‍රකරණය තුළ යෝජනා ඉදිරිපත් කැරෙනු ඇත.

## 3.1 ප්‍රාථමික හා ද්විතීයික විෂයමාලා සංවර්ධනය

3.1.1 දරුවාගේ වයසට ගැලපෙන පරිදි ද, ඔහුගේ සමබර සංවර්ධනයට දායක වන පරිදි ද දැනුම, කුසලතා, ආකල්ප කැටිවුණ, නිපුණතා පූර්ණ පුරවැසියෙකු සමාජ ගත කළ හැකි වන පරිදි විෂය මාලා සකස් විය යුතු ය.

3.1.2 විෂයමාලා සංශෝධන හා යාවත්කාලීන කිරීම සිදුවිය යුත්තේ වසර පහකට වතාවකි. ඒවා ද සිදු කළ යුත්තේ අධ්‍යාපනයේ අත්‍යාවශ්‍ය නව ප්‍රවනතාවයන් සැළකිල්ලට ගනිමිනි. කෙසේ වුවද විෂයමාලා කාලීනව සමාලෝචනය කිරීම වැදගත් වේ

3.1.3 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විෂයමාලා සකස් කිරීමේ දී එය ප්‍රායෝගික භාෂාවක් කර ගැනීම පිණිස පළමු ශ්‍රේණියේ සිටම ඇහුන්කන් දීම හා කථාව පිළිබඳ කුසලතා සමාන මට්ටමෙන් ඉස්මතු කොට ඇගයිය යුතු ය. ඒ සඳහා නොමිලේ ආධාරක පෙළ පොත් සැපයිය යුතු ය.

3.1.4 විෂයමාලා සංවර්ධනයේ දී වයස් කාණ්ඩ අනුව පහත දැක්වෙන මට්ටම් හඳුනාගෙන එකිනෙකට බැඳී ක්‍රමානුකූලව වර්ධනය වන විෂය මාලාවක් සකස් කළ යුතු ය.

ප්‍රාථමික මට්ටම → පළමුවන අවධිය (1, 2 ශ්‍රේණි)
දෙවන අවධිය (3, 4 ශ්‍රේණි)
තුන්වන අවධිය ( 5 ශ්‍රේණිය )

↓

කණිෂ්ඨ ද්විතීය මට්ටම (6, 7, 8, 9 ශ්‍රේණි)

↓

ජ්‍යෙෂ්ඨ ද්විතීය මට්ටම පළමුවන අවධිය (10, 11 ශ්‍රේණි)
දෙවන අවධිය (12, 13 ශ්‍රේණි)

3.1.5 කණිෂ්ඨ ද්විතීය මට්ටමේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය, භාෂා, ශාස්ත්‍ර, සමාජ හා ස්වාභාවික විද්‍යා, ගණිතය, සෞන්දර්යය, ජීවන හා තාක්ෂණික කුසලතා ප්‍රගුණ කිරීම අනිවාර්යය විය යුතු ය.

3.1.6 ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටමේ පළමු අවධිය මවුබස, ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, ව්‍යවසායකත්වය, ඉතිහාසය හා ආගම යන හර විෂයන්ගෙන්ද වෛකල්පිත විෂය කාණ්ඩ තුනකින් තෝරාගත් විෂයයන් දෙකකින් ද සමන්විත විය යුතු ය. එකී විෂය කාණ්ඩ තාක්ෂණය, අතිරේක භාෂා හා සෞන්දර්යය යන අංශ වලින් සමන්විත විය යුතු ය

3.1.7 ජාතික මට්ටමේ විභාගවලට අනිවාර්ය නොවූවද, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය අනිවාර්ය විෂයක් ලෙස පාසල්වල ඉගැන්විය යුතු ය.

3.1.8 මවුබස විෂයට සාහිත්‍ය සංරචකද එකතු කළ යුතු ය.

3.1.9 ඉංග්‍රීසි හා ගණිතය සඳහා එකම ප්‍රශ්න පත්‍රය තුළ මට්ටම් දෙකක කොටස් දෙකක් ඇතුලත් වන පරිදි විෂය මාලාව සකස් විය යුතු ය.

3.1.10 විද්‍යා, ගණිත, වාණිජ, කලා, තාක්ෂණික හා වෙනත් යන විෂය ධාරා හයකින් ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ දෙවන අදියර සඳහා විෂය මාලා සකස් කළ යුතු ය. තවද ඒ ඒ විෂය ධාරාවේ විෂයයන් තුනකට අමතරව සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හා ගණිතය වැනි විෂයන් සඳහා නිර්දේශ සකස් විය යුතු ය.

3.1.11 සෑම විෂය නිර්දේශයක් සංවර්ධනයේදීම නිපුණතා සංවර්ධනය හා පොදු හැකියා වර්ධනය පදනම් කරගත යුතු ය.

3.1.12 දරුවා දැනුම හඹා යමින්, ස්වයං ඉගෙන ගන්නෙකු බවට පත් කිරීමටත්, දැනුම විනෝදයක් හා සතුටක් බවට පත්වන පරිදීත් ශ්‍රී ලංකාවේ දරුවන්ගේ සාමාන්‍ය මධ්‍යස්ථ බුද්ධි මට්ටමට ගැළපෙන පරිදිත් බහුවිධ බුද්ධි නිපුණතා පදනම් කොට ගෙන සියලු විෂයමාලා සකස් විය යුතු ය.

3.1.13 විෂය මාලා ප්‍රතිසංස්කරණය කිරීමේ දී ජාත්‍යන්තර නව ප්‍රවණතා දේශීය තත්ත්වයන්ට ගලපා ගැනීමටත්, ඒවා පූර්ව පරීක්ෂණයට ලක් කිරීමටත් මාස 18කට නොඅඩු කාලයක් ලබා දිය යුතු ය.

3.1.14 ජාතික පොදු අරමුණුවලට පටහැනි නොවන පරිදි, ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විෂයමාලා අනුවර්තනය කර ගැනීමට පළාත්වලට නිදහස තිබිය යුතු ය.

## 3.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

3.2.1 පාසල් යාමේ හා ඉගෙන ගැනීමේ සැබෑ තෘප්තිය සෑම ළමයෙකුටම ලැබෙන පරිදි ගුරු භූමිකා වෙනස් විය යුතු අතර, ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම්, සහයෝගී ගවේෂණ, පරිසර සිද්ධි ආදී බහු විධ ඉගැනුම් ක්‍රම භාවිතා කිරීම හරහා ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතු ය.

3.2.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගී වන්නන්ට විචාරය, නව චින්තනය, නිරීක්ෂණය හා ප්‍රත්‍යාවේක්ෂණය, ප්‍රතිචාරය හා ප්‍රශ්න කිරීම, විස්තාරණය, සටහන් ලිවීම හා විවිධ සන්නිවේදන උපක්‍රම හරහා ඉදිරිපත් කිරීම, ඇගයීම වැනි භූමිකා රඟ දැක්වීමට ඉඩකඩ තිබිය යුතු ය.

3.2.3 පංති කාමර පුස්තකාල යොදවා ගැනීම හරහා දරුවා කියවීමට යොමු කළ යුතු ය.

3.2.4 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හරහා ජීවන නිපුණතා, බහුවිධ බුද්ධිය, වෙනත් පොදු නිපුණතා සංවර්ධනය කරමින් දරුවා තුළ වැඩදායක හා යාවජීව පුරුදු ගොඩනැඟිය යුතු ය.

3.2.5 විෂයමාලා තුළ දිවෙන පොදු ප්‍රවේශයක් යොදා ගනිමින් සදාචාර ධර්ම, අගයයන් [Values] හා ආකල්ප අන්තර්ග්‍රහණය සඳහා දරුවා යොමු කළ යුතු ය.

3.2.6 සෑම ගුරුවරයෙක්ම යම් තරමක උපදේශකයෙක් ද [Counsellor] විය යුතු ය. ඒ හරහා දරුවාගේ පුද්ගලික, සමාජයීය හා චිත්තවේග ප්‍රශ්න ඇති කරන ගැටලු ජයගෙන ආත්ම අවබෝධයෙන් හා ආත්ම අභිමානයෙන් ක්‍රියා කිරීමටත්, දරා ගැනීමේ හැකියාවත්, පරාජයට ඔරොත්තු දීමේ හැකියාවත් සිසුන් තුළ වර්ධනය කළ යුතු ය.

3.2.7 නව යෞවන වියේ දරුවන් සඳහා වෘත්තීය උපදේශන ලබා දෙමින් ස්වකීය විභවයන් හඳුනාගෙන වැඩ ලෝකයට බද්ධ වීමේ බලාපොරොත්තු, අරමුණු හා ඉලක්ක ඇති කර ගැනීමටත්, ඒ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අධිෂ්ඨාන ශක්තියත් ලබා දිය යුතු ය.

3.2.8 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හරහා දරුවන් දැනුමැත්තන් පමණක් නොව, යමක් කරන්නන් බවට ද පත් කළ යුතු ය. මේ සඳහා දෑත් දෙපා භාවිතා කිරීමේ අගයත්, දහඩියේ වටිනාකමත් අවධාරණය කළ යුතු ය.

3.2.9 1, 2, 3 ශ්‍රේණිවල දරුවන්ට ගෙදර වැඩ [Home work] පැවරීම අනිවාර්යය නොකළ යුතු අතර, ඉහළ මට්ටම් වලදී ද එය උචිත පරිදි සීමා කළ යුතු ය.

3.2.10 පාසල් බෑගයේ බර අවම කිරීම සඳහා විධිවිධාන පැනවිය යුතු ය.

3.2.11 කණිෂ්ඨ ද්විතීය මට්ටමේ සිට ඉහළට විෂයන් කිහිපයක් ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම හැකි තරම් ධෛර්යමත් කළ යුතු ය.

3.2.12 දඬුවම් කිරීම අත්‍යාවශ්‍ය අවස්ථාවන්ට සීමා කළ යුතු අතර, විනය ක්‍රියා මාර්ග සඳහා පොදු පිළිවෙතක් ඇති කර ගත යුතු ය. මේ සඳහා විනය නීති මාලාවක් ගුරු දෙගුරු සිසු සහභාගීත්වයෙන් සෑම පාසලක් විසින්ම සකස් කර ගත යුතු ය. එහිලා ශිෂ්‍යයන්ගේ යහපත් විනය හැසිරීම් සඳහා ප්‍රශංසා, රතු ලකුණු, සහතික පත් හා රන් පදක්කම් වැනි ධනාත්මක උපස්ථම්භක යොදවා ගත හැකි ය.

3.2.13 ශාරීරික වදහිංසා, හානි, අපචාර, නවක වදය, අපයෝජන ආදී විනය විරෝධී ක්‍රියා සඳහා සිවිල් නීතිය ක්‍රියාත්මක කළ යුතු ය.

3.2.14 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දරුවාගේ සමබර සංවර්ධනය සහතික වනු වස්, විෂයානුබද්ධ හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම්ද සෞඛ්‍ය හා පෝෂණයට අදාළ යෙදවුම්ද, දෙමාපිය ගුරුවර සහයෝගීත්වයද නොමඳව සැපයිය යුතු වේ.

3.2.15 විෂය නිර්දේශය තුළ ද, විෂයානුබද්ධ හා විෂය පරිබාහිර කටයුතු තුළ ද කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා විශාල ඉඩක් තිබිය යුතු අතර ; ඒ හරහා අන්තර් පුද්ගල, නායකත්ව හැකියාවන් සංවර්ධනය කිරීමට අමතරව අන්‍යයන්ගේ අදහස් වලට ගරු කරන, ඒවාට ඔරොත්තු දෙන සංහිඳියාවෙන්, සාමයෙන් හා සහජීවනයෙන් එකට ජීවත් විය හැකි ස්වයං පාලිත, විනයගරුක හා නීතිගරුක පුරවැසියෙකු බිහිකිරීමේ ප්‍රබල සමාජ සංවර්ධන සාධක ඉස්මතු විය යුතු ය.

3.2.16 සෑම මට්ටමකට ම විෂයන් සඳහා ගුරු මාර්ගෝපදේශ හා අත් පොත් සකස් කොට සියලු ගුරුවරුන්ට කලට වේලාවට නොමිලේ බෙදා හැරිය යුතු ය. මේ පොත් අවශ්‍ය අයට මිලදී ගැනීමට ද පහසුකම් සැළසිය යුතු ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති කරන විට මෙය වඩාත් වැදගත් වේ.

3.2.17 යෝජිත අධ්‍යාපන රූපවාහිනී නාලිකාව ඔස්සේ ද, වැඩමුළු හා ආදර්ශ වැඩසටහන් මඟින් ද එකී මාර්ගෝපදේශවල අරමුණු, සැළසුම්, ක්‍රියාත්මක කිරීම හා ස්වයං නියාමනය පිළිබඳ වෘත්තිමය පුහුණුවක් සියලු ගුරුවරුන්ට ලබා දිය යුතු ය. මේ ක්‍රියාවලිය හරහා විශේෂයෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට පසුබිම් වූ නව චින්තනය කුමක් ද යන්න ගුරුවරුන්ට සාක්ෂාත් කර දීම අතිශයින් වැදගත් වේ.

3.2.18 ගුරු මාර්ගෝපදේශ පැවතියද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී නව ප්‍රවේශ අධ්‍යනය කරමින් ද, අනුවර්තනය කරමින් හා නිර්මාණය කරමින් ද ගුරුවරයා වෘත්තීය භාවයට පොළඹවන නම්‍යශීලී බවක් පැවතිය යුතු ය.

3.2.19 ගුරු උපදේශකවරුන්ගේ කාර්යභාරය නිර්වචනය කොට ව්‍යවස්ථාපිත කළ යුතු ය. ඔවුන් පාසල් අධීක්ෂණය හා සුපරීක්ෂණය සඳහා ද යොදවා ගැනීමෙන් ඉගැන්වීමේ ගුණාත්මක භාවය විනිශ්චය කිරීම, සිදුවන අපගමන හඳුනා ගැනීම, නව ප්‍රතිසංස්කරණ ඉටු කර ගැනීම සඳහා ගුරුවරුන්ට සහය වීම, එකී නව උපකරණ හා දැනුම සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් යෝජනා කිරීම වැනි කටයුතු සඳහා ඔවුන් බල ගැන්විය යුතු ය.

3.2.20 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා සිදු කරන නව ප්‍රතිසංස්කරණ හා ව්‍යවහාරයන් පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමට විදුහල්පතිවරුන් යොමු කළ යුතු ය.

3.2.21 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යයක්ෂම කිරීම පිණිස පාසල් මට්ටමේ මානව, භෞතික, ද්‍රව්‍යමය, මූල්‍යමය හා කාල සම්පත්වල හිඩැස් හැකි තරමින් පුරවාගෙන ඒවා උපරිම ඵලදායීත්වයෙන් යුක්තව භාවිතා කළ යුතු ය. ඒ සඳහා නම්‍යශීලී වීමට විදුහල්පතිවරුන්ට ඉඩකඩ ලබා දිය යුතු ය.

3.2.22 පාසල පාදක "ගුණාත්මක යෙදවුම් වැය ශීර්ෂය" සක්‍රීය කොට බල ගැන්විය යුතු ය. මෙහිදී නේවාසිකාගාර පවත්වාගෙන යන පාසල් විශේෂයෙන් සලකා බැලිය යුතු ය.

3.2.23 පරීක්ෂණාගාර හා පුස්තකාල නොමැති අවස්ථාවලදී ජංගම පරීක්ෂණාගාර හා පුස්තකාල සංකල්පය දිරිගැන්විය යුතු ය.

3.2.24 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දැනුම සම්ප්‍රේෂණයට හා දැනුම ගණුදෙනුවට පමණක් සීමා නොවී ඒ ක්‍රියාවලිය තුළ ඇගයීම හා තක්සේරුව ද ප්‍රබලව ඉස්මතු විය යුතු ය. පාසල් පාදක අඛණ්ඩ තක්සේරු හා ඇගයීම් හරහා සිසු සංවර්ධන මට්ටම හඳුනාගෙන, ඒ අනුව ක්‍රියාත්මක වෙමින් අදාළ පරිසාධන මට්ටමට සිසුන් සාධනය කිරීම සඳහා ගුරු දෙගුරු වගකීම් ක්‍රියාත්මක කළ යුතු ය.

3.2.25 දරුවාට අනවශ්‍ය බරක් නොවන පරිදි පාසල පාදක සම්භවන තක්සේරු හා ඇගයීම් ක්‍රමවේදයක් සැළසුම් කර ගැනීම සඳහා ජාත්‍යන්තර හා ජාතික මට්ටමෙන් පවතින මෙවලම් පිළිබඳව ගුරුවරු දැනුවත් කොට, ආදර්ශ වැඩසටහන් හරහා ඔවුන් පුරුදු පුහුණු කළ යුතු ය.

3.2.26 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලබා දීමේ දී ඉංග්‍රීසි, විද්‍යාව හා ගණිතය විෂයන් සඳහා ලකුණුවලට පාසල් පාදක සම්භවන ලකුණුවලින් ප්‍රතිශතයක් එකතු කළ යුතු ය. පසුව සුදුසු පරිදි එසේ කරනු ලබන විෂයන් සංඛ්‍යාව වැඩි කළ හැකි ය.

3.2.27 ප්‍රාථමික අංශයේ සිසුන් ඇගයීමේ දී ඔවුන්ගේ ශාරීරික හා මානසික විභව්‍යතා ඇත්තේ බහුවිධ බුද්ධීන් අතරින් කවර බුද්ධීන් සඳහා දැයි හඳුනා ගැනීමේ හා දැනුම් දීමේ වැඩපිළිවෙලක් සකස් විය යුතු ය. එම සහජ බුද්ධීන් පිළිබඳව දෙමාපියන් දැනුවත් කොට විශේෂයෙන් නිවසේ දී හා පාසලෙන් පිටත දී එකී බුද්ධීන් වැඩි වැඩියෙන් අවදි කිරීමේ හා පෝෂණය කිරීමේ වැඩපිළිවෙලකට දෙමාපියන් යොමු කළ යුතු ය.

3.2.28 දරුවන්ගේ වෙනත් ආබාධ හඳුනා ගැනීම සඳහා අදාළ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ සහභාගීත්වයෙන් සායන පැවැත්විය යුතු ය. එකී හඳුනා ගැනීම් අනුව එම දරුවන් සඳහා දෙන අධ්‍යාපනය හා ඔවුන් පිළිබඳව වන සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම් සුදුසු පරිදි වෙනස් කළ යුතු ය.

3.2.29 පාසල් වාර පරීක්ෂණ පළාත් මට්ටමෙන් සංවිධානය කරමින්, සුතත්‍ය ක්‍රමයට සකස් කරන සම්පිණ්ඩිත ඇගයීම්වල වලංගුභාවය හා විශ්වාසනීයත්වය ඉහළ නැංවිය යුතු ය.

3.2.30 පාසල් මට්ටමේ ඇගයීම්වලදී දරුවා ආරම්භයේ සිටි මට්ටමේ සිට අත්පත් කරගෙන ඇති ප්‍රගතිය පෙන්වා දෙන පරීක්ෂණ ක්‍රම හා වාර්තා කිරීම් වැඩි වැඩියෙන් භාවිතා කළයුතු ය.

3.2.31 පාසල් පරීක්ෂණවලදී හා ප්‍රසිද්ධ විභාගවලදී පාසල් කාලය තුළ සංවර්ධනය කර ගන්නා දැනුම් හා නිපුණතා පදනම් කරගෙන සැබෑ ජීවිත අවස්ථාවන්ට මුහුණ දීම සඳහා දරුවන් දක්වන සූදානම පරීක්ෂා කළ හැකි සුතත්‍ය (Authentic) පරීක්ෂණ උපකරණ හා මෙවලම් හැකිතාක් අන්තර්ගත කළයුතු ය.

3.2.32 ජාතික මට්ටමේ විභාගවලදී සිසුන් අගය කරන විට සෛද්ධාන්තික දැනුම් අවබෝධය මැනීම පමණක් නොව එකී දැනුම සත්‍ය ජීවිතයේ ප්‍රායෝගික අවස්ථාවල ගැටලු විසඳීම සඳහා ද, නව නිපැයුම් හා විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා ද යොදවා ගත හැකි දැයි පරීක්ෂා කළ යුතු ය. එවැනි පිරික්සුම් මෙවලම් යොදවා ගැනීමට ජාතික මට්ටමේ පරීක්ෂණවල 20% - 40% අතර ප්‍රශ්න ප්‍රතිශතයක් වෙන් කළ යුතු ය.

3.2.33 ද්විතීය ජ්‍යෙෂ්ඨ මට්ටමේ විභාගවලදී විවිධ විෂයයන්ගෙන් සම්මත සූත්‍ර, සමීකරණ ආදියත්, යම් යම් සම්මත අගයයනුත් කටපාඩම් කරවීම වෙනුවට ඒවා මුද්‍රිතවම ලබා දිය යුතු ය.

3.2.34 මෙසේ සිසුන් අගය කිරීමේ දී අත් දකිනා ඒ ඒ සිසුන්ට ආවේණික දක්ෂතා හා බුද්ධීන් අනුව ඔවුන්ගේ අනාගත වෘත්තිය තීරණය කිරීමට සුදුසු වයසේ සිට ( 9 ශ්‍රේණියේ දී පමණ ) දරුවන්ට වෘත්තීය උපදේශන ලබා දිය යුතු ය. මේ සඳහා පළමු ශ්‍රේණියේ සිට ගොඩනැගෙන සන්තත ශිෂ්‍ය ඇගයීම් වාර්තාවක් සෑම ශිෂ්‍යයෙක් සම්බන්ධයෙන්ම පවත්වාගෙන යාමට සෑම පාසලකටම හැකි විය යුතු ය. සෑම පාසලක්ම සිසුන් සම්බන්ධව මෙවැනි වාර්තා හා දත්ත ඇතුළත් ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් (Studdent Information System) පවත්වාගෙන යා යුතු ය.

## 3.3 ඉගැන්වීමේ මාධ්‍යය

3.3.1 පෙර පාසල් හා ප්‍රාථමික අවදියේ දී ඉගැන්වීමේ මාධ්‍යය මව්බස විය යුතු ය. මෙරට ප්‍රධාන මාතෘ භාෂාවන් වන්නේ ජාතික භාෂාවන් වන සිංහල හා දෙමළය. මව්බස යනු උපතේ සිට දරුවාට උපරිම වශයෙන් අසන්නට ලැබුණු භාෂාව බැවින්දෙමාපියන් විසින් මව්බස තීරණය කළ යුතු ය.

3.3.2 ගෝලීය භාෂාව නොහොත් සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම සලකා මව්බස සිංහල හෝ දෙමළ වන දරුවන්ට දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්විය යුතු ය. 1 වන 2 වන ශ්‍රේණිවලදී මෙයට සරල ඇහුම්කන් දීමේ හා කථා කිරීමේ කුසලතාද, 3 වන ශ්‍රේණියේ සිට කියවීමේ හා ලිවීමේ කුසලතාද එකතු කළ යුතු ය.

3.3.3 මව්බස ඉංග්‍රීසි වන දරුවන් අනිවාර්යයෙන් දෙවන බස ලෙස සිංහල හෝ දෙමළ තෝරා ගත යුතු ය. තුන්වන ශ්‍රේණියේ සිට ඉහළට ඉතිරි ජාතික භාෂාවද ඉගැන්විය හැකි ය.

3.3.4 ද්විතියික පාසල්වල අධ්‍යාපන මාධ්‍යය, ද්විභාෂාමය විය යුතු ය. එනම් මව් භාෂාවෙන් විෂය කිහිපයක් සහ දෙවන භාෂාවෙන් විෂය කිහිපයක් ඉගැන්වීමයි.

3.3.5 සියලුම ගුරුවරුන් හැකිතාක් දුරට ද්විමාධ්‍ය (මව්බස හා ඉංග්‍රීසි) ගුරුවරුන් ලෙස ඉගෙනුම්, ඉගැන්වීම් කාර්යයේ යෙදවිය හැකිවන පරිදි ඔවුන් පුහුණු කළ යුතු ය. ඒ සඳහා ඇති පුහුණු ආයතන ශක්තිමත් කළ යුතු ය.

## 3.4 තක්සේරුව හා ඇගයීම

3.4.1 පාසල් පාදක (සම්භවන) ඇගයීම් හා සාමාන්‍ය විභාග (සම්පිණ්ඩිත) ඇගයීම් යන දෙආකාරයක ඇගයීම් සිදු විය යුතු අතර, ඒවා ඒකාබද්ධ කළ යුතු ය.

3.4.2 ජාතික මට්ටමේ ප්‍රසිද්ධ විභාගවලදී ද සුදුසු විෂයන් සඳහා පෙර වර්ෂ දෙකක පාසල් පාදක ඇගයීම්වල ලකුණු ප්‍රතිශතයක් ඇතුළු කළ හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

3.4.3 පාසල් පාදක ඇගයීම්වල වලංගුභාවය හා විශ්වාසනීයත්වය රැකෙන පරිදි ද, සංසන්දනය කළ හැකි වන පරිදි ද පැහැදිලි නිශ්චිත තක්සේරු ක්‍රම හා මෙවලම් හඳුන්වා දිය යුතු ය.

3.4.4 අධ්‍යාපන නිළධාරීන්ට, විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට පාසල් පාදක ඇගයීම්වල අරමුණු එම වගකීම, ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වයේ වැදගත්කම පැහැදිලි වන පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු ය. මේ සඳහා දෙමාපියන් තුළ ද අවබෝධයක් ඇති කිරීම වැදගත් වේ.

3.4.5 1968 අංක 25 දරණ විභාග පනත කාලීන වන පරිදි සංශෝධනය කළ යුතු ය.

3.4.6 ක්‍රීඩා ඇගයීම් සහතික හා දහම් පාසල් සහතික වලට ද තක්සේරුවේ දී නිසි වටිනාකමක් ලබා දිය යුතු ය.

## 3.5 පෙළපොත්

3.5.1 ජාතික විෂය මාලාවට හා අදාළ වයස් කාණ්ඩවලට ගැලපෙන පරිදි ද ජාතික අධ්‍යාපන ආයතනයේ මාර්ග උපදේශයන්ට අනුව ද පෙළ පොත් රචනා කර මුද්‍රණය කළ යුත්තේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවයි.

3.5.2 පෙළ පොත් සෑම දරුවෙකුටම ලැබෙන පරිදි නොමිලේ බෙදා හැරීම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල වගකීමයි.

3.5.3 පෙළ පොත්වල ආකර්ශනීයභාවය, ගුණාත්මකභාවය රැකගෙන ඒවා ශිෂ්‍යන්ගේ විෂය මාලාවට, වයසට, ප්‍රජානන ගුණාංගවලට, පෞරුෂ සංවර්ධනයට, අත්දැකීම්වලට හා පරිසරයට ගැළපෙන පරිදි සරලවත්, ලිහිල්වත් නිර්මාණය කිරීමට ද, ඒවායේ තාක්ෂණික අගය වැඩි දියුණු කිරීමට ද ඒවා සම්පාදනය කරන ලේඛකයන් තෝරා ගැනීමේ උපමාන සකස් කිරීමට ද මුද්‍රණය, බෙදා හැරීම හා භාවිතය පිළිබඳ උපදෙස් දෙනු පිණිස ද සුදුසු විශේෂඥයන්ගෙන් සැදුම්ලත් පෙළ පොත් මණ්ඩලයක් පිහිටු විය යුතු ය.

3.5.4 හැකි සෑම විටකම පෙළ පොත්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපත් එකවර සම්පාදනය කිරීම හරහා ඒවායේ නොගැළපීම් ඉවත් කර ගත යුතු ය.

3.5.5 පෙළ පොත්වලට අමතරව, අතිරේක කියවීම් පොත්, ජාතික විභාග සඳහා ප්‍රශ්නෝත්තර පොත්, වෙනත් අධ්‍යාපනයට අදාළ පරිවර්තන ආදිය සංස්කරණය කොට ප්‍රකාශ කිරීමට ද, ඒවා සාධාරණ මිලකට වෙළඳ පොළට නිකුත් කිරීමට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යොමු විය යුතු ය.

3.5.6 පෙළ පොත් හා ගුරු අත්පොත් ආදිය අවශ්‍ය දේශීය හා විදේශීය පුද්ගලයින්ට මිලදී ගත හැකි පරිදි ඒවායේ පිටකවර සැකසුම වෙනස් කොට වෙළඳපොලේ සුලභ කළ යුතු ය.

3.5.7 පෙළ පොත් බරෙන් අඩුවන පරිදි අවශ්‍ය අවස්ථාවලදී කොටස්වලට වෙන් කොට කුඩා ඒකක වශයෙන් මුද්‍රණය කිරීම වැදගත් වේ.

3.5.8 පෙළ පොත්, වැඩපොත්, සම්පත් පොත් හා ආදර්ශ ප්‍රශ්න උත්තර (විභාග) [Resource books] ආදියෙහි ඒ ඒ කොටස්වලට පාසල් පාදක ඇගයීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ මඟ පෙන්වීම් ද, ආදර්ශ පැවරුම් ද ඇතුළු කළ හැකි ය.

3.5.9 සියලු පෙළ පොත්, සියලු දෙනාට නොමිලේ පරිහරණය කළ හැකි වන පරිදි ඒවා වෙබ් අඩවියකින් ද ප්‍රකාශ කොට ප්‍රසිද්ධ කළ යුතු ය.

## 3.6 මඟ පෙන්වීම හා උපදේශනය

3.6.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලාවලට අනිවාර්යය විෂයක් ලෙස අධ්‍යාපන උපදේශනය, මනෝවිද්‍යා උපදේශනය හා වෘත්තීය උපදේශනය ලෙස ඇතුළු කොට සෑම ගුරුවරයෙකුගේම උපදේශක හැකියාවන් දියුණු කළ යුතු ය.

3.6.2 සෑම පාසලකම දරුවන්ට සමබර මනෝවිද්‍යාත්මක උපදේශන ලබා දිය හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතු ය. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2001/16 චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා පවතින බාධා ඉවත් කළ යුතු ය.

3.6.3 ප්‍රාථමික අවධියෙහි සිට දරුවාගේ විභවයන් හා දුර්වලකම් හඳුනාගෙන ඒ ඒ දරුවා ගැන වාර්තාවක් තබා ගැනීමෙන් උපදේශන සේවා බොහෝ අර්ථවත් කළ හැකි ය.

3.6.4 8-9 ශ්‍රේණිවල සිටින සිසුන්ගේ ආවේණික නිසඟ කුසලතා මෙන්ම ඔවුන්ගේ රුචිකත්වය හා හැකියාව අනුව ඔවුන් නිවැරදි වෘත්තීය මාර්ගයක ගමන් කරවිය හැකි වෘත්තීය උපදේශන සේවා පවත්වාගෙන යා යුතු ය. දරුවා කැමති විවිධ වෘත්තීන් කරා එළඹිය හැකි ක්‍රම, ඒ සඳහා අවශ්‍ය දැනුම, අනුගත විය යුතු පාඨමාලා, සම්බන්ධ විය යුතු ආයතන, අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගැන දරුවා දැනුවත් කරමින් ඔහු රැකියා ප්‍රමුඛ ඉගැනුම් මානසිකත්වයට පෙළඹවීම මෙහි අරමුණු විය යුතු ය.

3.6.5 ජාත්‍යන්තර හා දේශීය ව්‍යවසායක ක්ෂේත්‍රයේ පවතින තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා දීමට හා පවතින රැකියා අවස්ථා සඳහා ගැළපෙන පිරිසක් බිහි කිරීම සඳහා 10, 11, 12, 13 ශ්‍රේණිවල දරුවන් සඳහා ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සුදුසු ප්‍රවීනයන් ලවා මසකට වරක් පමණ දේශන පැවැත්විය යුතු ය.

3.6.6 වාර්ෂිකව යාවත් කාලීන කළ විවිධ වෘත්තීන් පිළිබඳව වූ කෘතියක් පාසල් පුස්තකාලවලට සැපයිය යුතු ය. සුදුසු වෙබ් අඩවියක් හරහා ද මේ දැනුවත් කිරීම සිදු කළ යුතු ය.

## 3.7 අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා දෙමාපිය කාර්යභාරය

3.7.1 දරුවා උපතේ සිට වැඩිහිටියෙකු වන තෙක්ම දෙමාපියන් හා වැඩිහිටියන්, දරුවාගේ සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියේ හවුල්කරුවන් විය යුතු ය. ඔවුන් තම සංස්කෘතිය, භාෂාව, අත්දැකීම්, දැනුම, තාක්ෂණය, සිරිත් විරිත්, යහ ගුණධර්ම, කලාව, ආගම, සමාජ අගයයන් හා දක්ෂතා හැකි පමණින් ඊළඟ පරම්පරාවට පවරා දිය යුතු ය. මේ සඳහා ඔවුන් සැමවිටම වචනයෙන් හා ක්‍රියාවෙන් ආදර්ශමත් විය යුතු ය.

3.7.2 සමාජය එක තැනම පල්වීම වළක්වනු වස්, වැඩිහිටියන් මෙසේ සිදු කරන පවරාදීම්වලදී, පැහැදිලිවම ඊළඟ පරපුරට ඒ පවරාදීම් ඉක්මවා ගොස් ඒවාට අලුත් සිතුම් පැතුම්, නව කෘතීන් හා ප්‍රබන්ධ, නව නිපැයුම් එකතු කරන්නටත්, අලුතෙන් හිතන්නටත් ඉඩකඩ තැබිය යුතු ය. යහපත් ප්‍රවණතා ඇති නව්‍යකරණ හා වෙනස් කිරීම් වලට ඊළඟ පරපුරට ඉඩදිය යුතු අතර, ඒවා අගය කළ යුතු ය. පුද්ගල හා සමාජ සංවර්ධනය ඇති විය හැක්කේ මෙකී නව්‍යකරණ හරහා පමණි.

3.7.3 1979 දී සකස් කළ මාපිය ප්‍රඥප්තියෙහි [Parent's Charter] අඩංගු අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව සියලු දෙමාපියන් හා අධ්‍යාපනයට සම්බන්ධ සියලු දෙනා දැනුවත් කොට එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට දෙමාපියන් උත්සුක කළ යුතු ය. අධ්‍යාපනයට සම්බන්ධ සියලු නිළධාරීන් හා ගුරුවරුන් විසින් මේ සඳහා දෙමාපියන් දිරිගැන්විය යුතු ය.

3.7.4 දෙමාපියන් සම්බන්ධ පාසල් සංවර්ධන සමිතියක් හෝ සමිතියක් සියලු පාසල්වල පිහිටුවා ඒ හරහා අධ්‍යාපන ක්‍රියාවලියට සියලු දෙමාපියන් සම්බන්ධ කර ගත යුතු ය.

3.7.5 පිළිසිඳ ගත් දින සිට සෞඛ්‍ය සම්පන්න, නිරෝගී දරුවෙකු බිහි කිරීමටත් , ජන්මගත විභවයන් හඳුනාගෙන දරුවන් ජයග්‍රාහී මාර්ගයට ගෙන යාමටත්, ආත්ම කේන්ද්‍රීය නොවන, අනෙක් දරුවන් හා සමාජානුගත වෙමින් සම්පත් බෙදා හදා ගන්නා දරුවෙකු සාදාගැනීමටත්, දෙමාපියන් උනන්දු විය යුතු ය. තරගකාරී ලොවේ කර්කශභාවයට හා අටලෝ දහමට ඔරොත්තු දෙන

පන්නරය ලබා දීමට අවශ්‍ය තරම් අභියෝග දරුවා වෙත ඉදිරිපත් කිරීමටත්, ජයග්‍රහණ හඹා ගිය ද පරාජයේ අභිහිර උපේක්ෂාවෙන් විඳ ගැනීමට දරුවා පුහුණු කිරීමටත් දෙමාපියන් පුරුදු පුහුණු විය යුතු ය. මේ සඳහා අවශ්‍ය වැඩසටහන් අධ්‍යාපන රූපවාහිනිය වැනි මාධ්‍ය හරහා ඉදිරිපත් කළ යුතු ය.

3.7.6 විදුහල්පතිවරු පාසල් වාරයකට වරක්වත් (වාර අවසාන විභාගයෙන් පසු) දෙමාපිය දින පවත්වා දරුවන්ගේ තොරතුරු දෙමාපියන් සමඟ බෙදා හදා ගනිමින් අවශ්‍ය උපදෙස් ලබා දීම කළ යුතු ය. දෙමාපියන් සමඟ නිරන්තර සන්නිවේදනයක් පවත්වා ගැනීම සඳහා දරුවා දිනපතා පාසල වෙත රැගෙන ආ යුතු "ශිෂ්‍ය වාර්තා පොතක්" භාවිතා කළ යුතු ය.

3.7.7 දරුවා වෙත පාසලෙන් ලබා දෙන පැවරුම්, ඉටු කිරීමට දරුවා ධෛර්යමත් කළ යුතු ය. එහෙත් ඒවා දෙමාපියන් විසින් ඉටු නොකළ යුතු ය.

## 3.8 සාරධර්ම අධ්‍යාපනය

3.8.1 අධ්‍යාපනයේ මූලිකම අරමුණක් විය යුත්තේ "එකට ජීවත් වීමට ඉගෙන ගැනීමයි" [Learning to Live Together] සමාජ ඒකාග්‍රතාවය හා ස්ථාවරත්වය ඇති කර ආගම්, ජාති, කුල-මල ආදී විවිධත්වයක් ඇති ලෝකයේ ඒ විවිධත්වයන් තුළ ඇති ශක්තීන් එකතු කර ගෙන සංහිඳියාවෙන් ජීවත් විය හැකි දරුවෙකු බිහි විය යුතු ය.

3.8.2 අන් අයගේ ජීවිත ගැන සැලකිල්ලක් දක්වා, සෑම ආකාරයකම හිංසනය, ප්‍රචණ්ඩත්වය, දූෂණය, අධිපාරිභෝගිකත්වය, උග්‍ර ආත්මාර්ථකාමීත්වය ඉක්මවා ගිය, ප්‍රජා හා සමාජ වගකීමකින් යුත් පුරවැසියෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය මානසික පසුබිම දරුවා තුළ ඇති කළ හැකි වැඩපිළිවෙලක් සෑම විෂය නිර්දේශයක් තුළම චක්‍රාකාරයෙන් දිවෙන පරිදි; විෂය නිර්දේශ සකස් කළ යුතු වේ.

3.8.3 ඉහත කී ගුණාංග දරුවා තුළ වර්ධනය කොට යහපත් ආකල්ප වලින් හෙබි පුරවැසියෙකු බිහි කිරීම පිළිබඳ වගකීමට සියලු ගුරුවරු උරදිය යුතු වේ. අවබෝධයෙන් හා අවදියෙන් සිටින ගුරුවරයාට මේ සඳහා ආගමික අධ්‍යාපනයට අමතරව, සෑම පාඩමක්ම යොදවා ගත හැකි ය. විෂය සමගාමී ක්‍රියාකාරකම් ද සාරධර්ම අධ්‍යාපනයට අත්වැලක් කර ගත යුතු ය.

3.8.4 දරුවාගේ සාරධර්ම අධ්‍යාපනය ඵලදායී වන්නේ දෙමාපිය, ගුරුවර හා වැඩිහිටි පරපුර ආදර්ශමත් වීමෙන්ය.

3.8.5 අධ්‍යාපනයේ නියම පරමාර්ථ පිළිබඳව දෙමාපිය වැඩිහිටියන් දැනුවත් කිරීමත්, අදාළ ක්‍රමවේදයන් ඔවුනට කියා දීමත් අධ්‍යාපන බලධාරීන්ගේ වගකීම වේ. ජාතික අධ්‍යාපන ආයතනය හරහා ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපනයටම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් මගින් වැඩිහිටියන්ට ජාතික මට්ටමෙන් මේ පිළිබඳව විශාල අවබෝධයක් ලබා දිය හැකි ය. දෙමාපියන් දරුවෙකුගේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් විය යුත්තේ හා ක්‍රියාත්මක විය යුත්තේ දරුවා පිළිසිඳ ගැනීමටත් පෙර සිට වීම මීට හේතුවයි.

3.8.6 ඉරිදා දිනවල පෙරවරුව සියලු ආගම්වල දහම් අධ්‍යාපන කටයුතු සඳහා වෙන් කොට තැබීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතු ය.

3.8.7 සාරධර්ම පරිහානියට හේතුවන වැඩසටහන් ජන සන්නිවේදන මාධ්‍යවල විකාශනය වන වෙලාව පිළිබඳව අධීක්ෂණය හා නියාමනය කළ යුතු ය.

3.8.8 පන්තිකාමර තුළ භාවිත කරන, අනුමත තාක්ෂණ උපකරණ හැර වෙනත් උපකරණ පාසල තුලට ගෙන ඒම තහනම් විය යුතු ය.

3.8.9 පාසල් දරුවන්ට ජංගම දුරකථන භාවිතය තහනම් කළ යුතු ය.

## 3.9 අධ්‍යාපන තාක්ෂණය හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

3.9.1 අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදවා ගැනීමේ ප්‍රථම පියවර ලෙස පාසල් පද්ධතියේ උග්‍ර විෂමතා තුරන් වන සේ පාසල්වලට අවශ්‍ය ගුණාත්මක පහසුකම් ලබා දිය යුතු ය.

3.9.2 පාසල්වල පුස්තකාල සංවර්ධනය කර දරුවන් තුළ කියවීමේ පුරුදු වැඩි දියුණු කළ යුතු ය.

3.9.3 නූතන ලෝකයේ අධ්‍යාපනය ලබා දීම සඳහා යොදවා ගන්නා තාක්ෂණික ක්‍රමවේද (අන්තර්ජාලය, බහුමාධ්‍ය තාක්ෂණය, පරිගණක තාක්ෂණය, දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද, රූපවාහිනිය ඇතුළු ඉලෙක්ට්‍රොනික මාධ්‍ය) මෙරට දරුවන් සඳහා ද අත් විඳීමට ඉඩ දීම හරහා ඔවුන් නව සහශ්‍රකයේ දරුවන් බවට පත් කළ යුතු ය.

3.9.4 කෙසේ වුවද මෙම කටයුත්තේදී වියදම් "දරා ගත" හැකි වීමත්, සම්පත් සාධාරණව බෙදී යාමත් පිළිබඳ උපරිම අවධානයක් යොමු විය යුතු ය.

3.9.5 දිවයින පුරා සාධාරණව විසිරී යන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අවම වශයෙන් තුනක් වන පරිදි තෝරා ගත් ද්විතීයික පාසල් 1000 ක තාක්ෂණික විද්‍යාගාර ගොඩනැගිලි ඉදි කළ යුතු ය. මේවායේ භාෂාගාරයක්, ගණිතාගාරයක් , දුරස්ථ අධ්‍යාපන ඒකකයක් හා පරිගණක විද්‍යාගාරයක් බැගින් විද්‍යාගාර හතරක් සකස් කොට ඒවායේ සුදුසු විෂයමාලා මෙවලම් භාවිතා කිරීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය උද්දීපනය කිරීමට තාක්ෂණය යොදවා ගත හැකි ය.

3.9.6 මේ ද්විතියික පාසල් දහස ක්‍රමානුකූලව පෝෂණය කිරීම මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන විවිධ ප්‍රශ්න ගණනාවකට තාක්ෂණය ඇතුළු අනෙකුත් ක්‍රමවේද හරහා ප්‍රතිකර්ම යෙදිය හැකි ය.

3.9.7 තොරතුරු තාක්ෂණය පාසල් අතර ප්‍රචලිත වීමත් සමඟම ක්‍රම ක්‍රමයෙන් විෂය මාලාවේ හැකි සෑම විෂයක්ම ඉගැන්වීම සඳහා යොදවා ගන්නා; තාක්ෂණික සන්නිවේදන මෙවලම් හා අන්තර්ගතය වැඩි කළ යුතු ය.

3.9.8 කෙසේ වුවද, තොරතුරු තාක්ෂණය භාවිතය තුළින් ලැබෙන යාන්ත්‍රික කුසලතා හේතුවෙන් දරුවන්ගේ ප්‍රජානන කුසලතා යටපත් වීමට ඉඩ නොතැබිය යුතු ය.

3.9.9 පරිගණක භාවිතය, ඒවායේ නඩත්තුව හා තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කළ හැකි වන පරිදි ගුරුවරු, පාසල් ප්‍රධානීන් හා අධ්‍යාපන පරිපාලකයන් පුහුණු කර සංවර්ධනය කර ගත යුතු ය.

3.9.10 අධ්‍යාපන තාක්ෂණය හා පරිගණක තාක්ෂණය සඳහා භාවිතා කරන සියලු අන්තර්ජාල පහසුකම් වලින් අනවශ්‍ය වෙබ් අඩවි පෙරා ඉවත් කළ යුතු ය. වයස අවුරුදු 19 දක්වා වූ පාසල් දරුවන් පරිගණක ආශ්‍රිත දුරාචාර හා අපරාධ වලින් ඉවත් කර ගැනීමටත් අවශ්‍ය නෛතික පියවර යෝජනා කොට ක්‍රියාත්මක කළ යුතු ය. මෙකී වයස්වල දරුවන් අසභ්‍ය, විකෘති වෙබ් අඩවි වලට පිවිසීම හා විවිධ සමාජ ජාලයන් හරහා ශ්‍රී ලාංකික සංස්කෘතියට නොගැළපෙන සමාජ සම්බන්ධතා ඇති කර ගැනීමත් නීතියෙන් තහනම් කළ යුතු ය.

3.9.11 පාසල් කාලයෙන් පසු පාසල් පරිගණක විද්‍යාගාරවල පහසුකම් පාසල අවට ප්‍රජාවට ලබා දීම හරහා පාසල් නඩත්තුව සඳහා ආදායමක් ලබා ගැනීමට පාසල් වලට අවසර ලබා දිය යුතු ය.

3.9.12 උසස් පෙළ සඳහා ගණක යන්ත්‍ර [calculators] භාවිතයට ඉඩ දිය යුතු ය.

## 3.10 ඉගෙනීමේ පරිසරය හා පාසල්වල ඇති යටිතල පහසුකම්

3.10.1 පාසල් පරිසරය දරුවාට සුරක්ෂිතවූ ද, කලාපීය දේශගුණයට ගැළපෙන ලෙස සකස් කරන ලද්දා වූ ද, ඉගෙනුමට හිතකර, ළමා මිතුරු, ආකර්ෂණීය පරිසරයක් විය යුතු ය.

3.10.2 උපරිම වශයෙන් ළමයි 35 කට ඉගෙන ගත හැකි පන්ති කාමරයක සම්මත වර්ග ප්‍රමාණය වර්ග අඩි 460 කට වැඩි විය යුතු අතර, ඒවා හොඳින් වෙන් වී තිබිය යුතු ය. එය තුළ ඇති පුටු, මේස, ලිවීමේ ලෑලි, අල්මාරි, දැන්වීම් පුවරු ඇතුලුව සමස්ථ වාතාවරණය විධිමත්ව දරුවාගේ වයසට ගැළපෙන පරිදි සකස් කර තිබිය යුතු ය.

3.10.3 පාසල් භූමි පරිභෝජන රටාවලිය [Master plan] සඳහා සම්මත සැලසුමක් තිබිය යුතු ය. ඊට අමතරව අවම වශයෙන් කාර්යාලයක්, ගුරු කාමරයක්, අනෙකුත් සම්පත් කාමර, පුස්තකාලයක්, ක්‍රීඩා පිටියක්, පානීය ජලය, වැසිකිලි කැසිකිලි හා ආරක්ෂිත ගබඩා කාමරයක් තිබිය යුතු ය.

3.10.4 පාසල්වලට රැස්වීම් ශාලාවක් ද ලබා දිය යුතු ය. සමස්ත පාසල නඩත්තු කරමින්, පිරිසිදුව පවත්වාගෙන යාම විදුහල්පති, ආචාර්යවරුන් හා සිසුන් ඇතුලු පාසල් සංවර්ධන සමිතියේ වගකීම විය යුතු ය.

3.10.5 රටක අනාගත සුභසිද්ධිය සඳහා කෙරෙන වැදගත්ම ආයෝජනය අධ්‍යාපනය සඳහා කෙරෙන ආයෝජනය බව පිළිගනිමින් සැම වසරකම අයවැයේදී අවම වශයෙන් රජයේ සමස්ත වියදමෙන් නිශ්චිත හා ප්‍රමාණවත් ප්‍රතිශතයක් සාමාන්‍ය අධ්‍යාපනයේ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීමට රජය ප්‍රමුඛතාවය දිය යුතු ය.

3.10.6 පාසලේ ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් වැඩිදියුණු කර ගැනීම පිණිස ප්‍රජාපාදක සිවිල් සංවිධාන හා ආදී ශිෂ්‍ය සංගම් ද යොදවා ගත හැකි ය.

## 3.11 පෞද්ගලික උපකාරක පංති

3.11.1 දරුවාට අනවශ්‍ය බරක් ඇති නොවන පරිදි විෂයමාලා අන්තර්ගතය, ඉගැන්වීමේ ක්‍රම සකස් කර දීම මඟින් ද, නිර්මාණාත්මක හා තර්කන කුසලතා එළි දැක්වෙන ප්‍රශ්න පත්‍ර හරහා දරුවා කට පාඩමෙන් ඔබ්බට ගෙන යාම මඟින් ද දුර්වල ළමයි සඳහා පාසලේම පවත්වන අතිරේක ප්‍රතිකර්ම ඉගැන්වීම් ආදිය හරහා ද දරුවා පෞද්ගලික උපකාරක පන්තිවල පිහිට සෙවීම් අඩු කර ගත හැකි ය.

3.11.2 සැම ගුරුවරයෙකුම නොකඩවා, කළට වේලාවට අදාළ පන්තියට ගොස් සුදුසු පාඩම් සැලසුමක් ඇතිව ආකර්ශනීය ලෙස පාඩම උගන්වන්නේ නම් දරුවාට පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳ අවශ්‍යතාවයක් ඇති නොවේ.

3.11.3 5 වැනි ශ්‍රේණියෙන් පසු සෑම දරුවෙකුටම හොඳ ද්විතීයික පාසලක් සහතික කරන ද්විතීයික පාසල් 1000 වැනි වැඩපිළිවෙලක් හරහා 5 ශිෂ්‍යත්වයේ පීඩනය නැති කොට කුඩා දරුවන් උපකාරක පන්ති පිහිට පැතීම වළක්වාලිය යුතු ය.

3.11.4 සම්මත පාසල් කාලය තුළ පාසල් දරුවන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම හා ඒවාට සහභාගී වීම තහනම් කළ යුතු ය.

3.11.5 පිළිගත හැකි හේතුවක් නොමැති නම් සෑම පන්තියකම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පැමිණීමේ ප්‍රතිශතය 80% ට වැඩි විය යුතු ය. පාසල් මට්ටමේ, ජාතික මට්ටමේ විභාග වලදී ද, ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේදී ද පැමිණීමේ ප්‍රතිශතය සැලකිල්ලට ගත යුතු ය.

3.11.6 සම්මත පාසල් කාලයෙන් පසු දරුවාගේ සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිලාභ නොමැතිව කැපවෙන ගුරුවරු සඳහා අගය කිරීමක් සිදු විය යුතු ය.

3.11.7 පෞද්ගලික උපකාරක පන්ති පවත්වන ගුරුවරුන්ගේ සුදුසුකම් හා පවත්වන ස්ථානවල යටිතල පහසුකම් පිළිබඳ නිර්ණායකයන් හා පාලනයක් තිබිය යුතු ය.

## 3.12 සන්නිවේදන මාධ්‍යය හා දරුවා

3.12.1 මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය, බලපෑම, මාධ්‍ය පණිවුඩ අර්ථකථනය ආදිය පිළිබඳව දරුවා හා දෙමාපියන් දැනුවත් කළ යුතු ය.

3.12.2 ජාතික අධ්‍යාපන ආයතනයේ අධීක්ෂණය යටතේ සුදුසු ළමා පොත්, සඟරා, නාට්‍ය, චිත්‍ර හා කලාත්මක ප්‍රකාශන, ළමා චිත්‍රපට හා වීඩියෝ පට නිෂ්පාදනය හා බෙදාහැරීම දිරිමත් කළ යුතු ය.

3.12.3 අන්තර්ජාලය හා අනෙකුත් සමාජයීය ජාලයන් හරහා දරුවා අයහපත් සම්බන්ධතා හා තොරතුරු වලට විවර වීම වැළැක්වීමට අදාළ තාක්ෂණික හා අනෙකුත් උපාය මාර්ග පිළිබඳව ගුරුවරු හා දෙමාපියන් දැනුවත් කොට ඒවා ක්‍රියාත්මක කළ යුතු අතර හොඳ, නරක වෙන් කර ගැනීමටත්, ස්වයංපාලනයක් ඇති කර ගැනීම සඳහාත් දරුවා පුහුණු කළ යුතු ය.

3.12.4 පාසල් යන වයසේ දරුවන් පාසල තුළ ජංගම දුරකථන භාවිතය තහනම් කළ යුතු ය. පාසලින් පිටතදී වුවද මේ පහසුකම් අත්‍යාවශ්‍ය විටෙක පමණක් ලබා දීමට දෙමාපියන් දැනුවත් කළ යුතුය.

3.12.5 ජාතික අධ්‍යාපන ආයතනය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ රූපවාහිනී නාලිකා දෙකක් අධ්‍යාපනය සඳහාම වෙන් කොට පවත්වාගෙන යා යුතු ය. ඉන් එකක් පෙරවරුවේ පාසල් ඉලක්ක කරගත් දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සඳහා ද , හවස් වරුවේ දරුවන් ඉලක්ක කර ගත් විෂයානුබද්ධ පාඨමාලා සඳහා ද විය යුතු ය. අනෙක් නාලිකාව පෙරවරුවේ දෙමාපිය, වැඩිහිටි අධ්‍යාපනය සඳහා ද, පස්වරුවේ ගුරු අධ්‍යාපනය හා ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහාද වෙන් විය යුතුය.

## 3.13 පුහුණුව මුල් කරගත් සේවය

අ.පො.ස. (සා.පෙළ) හා (උ.පෙළ) විභාග වලින් පසු යෝජිත පාසල් පාදක වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවලට යොමු වන ශිෂ්‍යයන් තම අධ්‍යයන කාලයෙන් තීන්දු කළ කොටසක් අදාළ වෘත්තීය ක්ෂේත්‍රයට ආවේණික විවිධ ආයතනවල සේවයෙහි යොදවමින් ඔවුන්ගේ අත්දැකීම් හා නිපුණතා සංවර්ධය කර ගැනීමට ඉඩ දීම ජාතික ප්‍රතිපත්තියක් විය යුතු ය. මෙය ඔවුන් සඳහා සිදු කෙරෙන අනිවාර්ය සේවා අධ්‍යාපනයක් ලෙස සැලකිය යුතු අතර, අදාළ ආයතන වලින් මෙම තරුණ පුහුණුවන්නන් සඳහා යම් ගෙවීමක් කළ හැකි ය.

# 4 අධ්‍යාපන කළමනාකරණය සහ නායකත්වය

අධ්‍යාපන කළමනාකරණය හා නායකත්වයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ඵලදායී පාසලක් බිහි කිරීම ය. ඵලදායී පාසලක සාර්ථක කළමනාකරණයක් තිබිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය සහයෝගය හා නායකත්වය ලබා දෙන සංවිධානයක් අවශ්‍ය කෙරේ. පාසලේ ප්‍රධානියා ඵලදායී පාසලක කළමනාකරණ හා පරිපාලන කටයුතුවල මූලිකයා වේ. අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීමෙහි ලා විදුහල්පතිගේ භූමිකාව; අධ්‍යාපන නායකත්වය, සැලසුම්කරණය, උත්ප්‍රේරණය, ආරම්භක ශක්තිය සහ අධීක්ෂණය යන කාර්යයන් අභියෝගයට ලක් කළ නොහැකිය. දරුවන්ගේ ඉගෙනීම හා සමස්ථ පෞරුෂ වර්ධනය අරභයා පාසලේ නායකත්වය අතිශය වැදගත් සාධකයකි. පාසල් අධීක්ෂණය හා මඟ පෙන්වීමේ පරමාර්ථය වන්නේ ඉගැන්වීමේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්ය වඩාත් සුඛනම්‍ය කර ගැනීම සඳහා ගුරුවරුන් අභිප්‍රේරණය කරමින් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීම පිණිස භෞතික හා මානව සම්පත් උපරිම අයුරින් උපයෝජනය කර ගැනීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 13 වැනි සංශෝධනය එක් කළ පසු සාමාන්‍ය අධ්‍යාපනයේ වගකීම් රාශියක් පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. එසේ වුවද අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා ජාතික මට්ටමේ මෙහෙයුම් නිර්ණායක තීරණය කිරීම, අධ්‍යාපන සැලසුම්කරණය, කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මකබව තක්සේරු කිරීම, ගුරු අධ්‍යාපනය හා සංවර්ධනය, ජාතික මට්ටමේ විභාග පැවැත්වීම, පාසල් පෙළ පොත් නිෂ්පාදනය හා බෙදා හැරීම, පාසල් නිල ඇඳුම් සැපයීම, ජාතික පාසල් හා විශේෂ පාසල් පරිපාලනය කිරීම වැනි ප්‍රධාන කාර්යයන් ගණනාවක්ම මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණය විසින් තවමත් සිදු කරනු ලැබේ. මේ ආදී වශයෙන් අධ්‍යාපන කළමනාකරණය හා නායකත්වය, වගකීම් හා කාර්යභාරය වඩාත් කාර්යයක්ෂම හා යථා යෝග්‍ය පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන මෙලෙස යෝජනා කරමු.

## 4.1 සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ කළමනාකරණය

4.1.1 සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා වූ කළමනාකරණ ව්‍යුහය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් මත තීරණය විය යුතු ය. මෙහි දී දැනට පවතින ව්‍යුහයම තවත් තර්කානුකූල කොට සකස් කිරීමත්, ඒ ඒ මට්ටමට අදාළ බලතල හා කාර්යභාරය තියුණුව හා නිවැරදිව අර්ථකථනය කිරීමත් සිදු කළ යුතු ය.

4.1.2 ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ පද්ධතිය කාර්යයක්ෂම කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන විද්‍යාපීඨ, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීමට කමිටුවක් පත් කළ යුතු ය.

4.1.3 පළාත් මට්ටමේ දී ඉහත අර්ථකථනය වූ බලතල ස්වාධීනව, නිරවුල්ව හා කාර්යයක්ෂමව ක්‍රියාත්මක කළ හැකි පළාත්, දිස්ත්‍රික්ක හා කොට්ඨාශ අධ්‍යක්ෂකවරු පත් කළ යුතු ය. ඔවුන්ට තිබිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා පුහුණුව කුමක් විය යුතු යැයි තීරණය කොට ප්‍රතිපත්ති ගත කර එකී සුදුසුකම් ඇති අධ්‍යක්ෂකවරු පමණක් සේවයෙහි යෙදිය යුතු ය.

4.1.4 ඉහත විස්තර කළ කාර්යභාරය හා බලතල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සෑහෙන පරිදි මානව හා භෞතික සම්පත් සැපයීම අනිවාර්ය විය යුතු ය. මේ සඳහා පරිපාලන නිළධාරීන් බඳවා ගැනීමේ විභාග, ඇගයීම් හා සම්මුඛ පරීක්ෂණ වාර්ෂිකව සිදුවිය යුතු අතර, උවමනා භෞතික සම්පත් වාර්ෂිකව නිර්ණය කොට සැපයිය යුතු ය.

4.1.5 පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රා. ලේකම් කොට්ඨාශවලට අනුයුක්ත සෑම නිළධාරියෙකුගේම රැකියා කාර්යභාරය [Job description] නිවැරදිව නිර්වචනය කර එකී කාර්යභාරය ස්වාධීනව කරගෙන යාමට අවශ්‍ය අධිකාරිය ඔවුන්ට පැවරිය යුතු ය. ඒ සඳහා ඔවුන් වග විය යුතු ය. මේ සඳහා කාර්ය සාධන ඉලක්ක, අධීක්ෂණය හා සාධන ඇගයීම් සිදු කළ හැකි ය.

4.1.6 දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට ප්‍රමාණවත් තරම් නිළධාරීන් පත් කොට ඔවුන් බල ගන්වා දෙමළ පාසල් සම්බන්ධ පරිපාලන කටයුතු අප්‍රමාදව කරගෙන යාමට සියලු පහසුකම් සැළසිය යුතු ය.

4.1.7 කළමනාකරණ ව්‍යුහයේ ඕනෑම මට්ටමක සේවකයෙකුගේ නිර්මාණශීලීබව, හැකියාව හා ඵලදායකත්වය සැලකිල්ලට ගෙන එය පිළිගැනීම, ප්‍රයෝජනයට ගැනීම, දිරි දීම, අභිනන්දනය හා තිළිණ පිරිනැමීම සිදු කළ යුතු ය.

4.1.8 කළමනාකරණ ව්‍යුහයේ ඕනෑම මට්ටමක සේවකයකු එකී සේවය සඳහා නුසුදුසු බව සනාථ වුවහොත්, ඔහු හෝ ඇය සුදුසු වෙනත් රාජ්‍ය සේවයකට අනුගත කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

4.1.9 රේඛීය අමාත්‍යාංශය හා සෑම මට්ටමකම පළාත් අධ්‍යාපන බලධාරීන් අතර සුහද සහයෝගීතාවයක් ගොඩ නැගිය යුතු ය.

## 4.2 පාසල් කළමනාකරණ හා නායකත්වය

4.2.1 විදුහල්පති ප්‍රධාන ; පාසල් පාර්ශවකරුවන් අතරෙන් තෝරා ගත් පළපුරුදු නැණවත් කණ්ඩායමක් යොදවා පාසල් පාදක කළමනාකරණය දිරිමත් කළ යුතු ය.

4.2.2 පාසලේ සංවර්ධනය හා සාර්ථකත්වය සඳහා පාසල් සංවර්ධන සමිතිය යොදවා ගත හැකි ය. එකී පාසල් සංවර්ධන සමිතිය යටතේ පාසල් කළමනාකරණ කමිටුවක් ද පිහිටුවා ගත හැකි ය. කළමනාකරණ කමිටුව යෝජනා කරන ස්වාධීන කමිටුවකින් වාර්ෂික පාසල් කාර්ය සාධන හා විගණන වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතු ය.

4.2.3 පාසලේ විදුහල්පති ; නාමික නායකයා ලෙස ද [Figure head], සැබෑ නායකයා ලෙස ද, සම්බන්ධතා රකින්නා ලෙස ද, තොරතුරු තෝරා බේරා බෙදා හරින්නා ලෙස ද, ප්‍රකාශකයා ලෙස ද, ව්‍යවසායයෙකු ලෙස ද, ගැටලු නිවාරණය කරන්නෙකු ලෙස ද, සම්පත් බෙදා හරින්නෙකු ලෙස ද , සම්මුතිකරුවෙකු ලෙස ද ක්‍රියා කළ යුතු ය.

4.2.4 සියලු ලිපි ලේඛන කටයුතු සිදු කළ හැකි පාසල් පරිපාලන ලේඛකාධිකාරීවරයෙක් වෙත ව්‍යුහගත පාසල් පරිපාලන කටයුතු පවරා විදුහල්පති පාසලෙන් අරමුණු වන කරුණු සිසුන්ට ගලා යන්නේද යන කාරණය සාක්ෂාත් කිරීම පිණිස, විශේෂයෙන් ගුරුවරුන්ගේ උපරිම ප්‍රයෝජනය දරුවන්ට ලබා දීම පිණිස පාසල් කාලය තුළ කටයුතු කළ යුතු ය.

4.2.5 වගකීමෙන් යුතුව පාසල් මුදල් පරිහරණය කිරීම, අවශ්‍ය සියලු අංශයන් සඳහා වූ සංවර්ධනාත්මක මැදිහත්වීම, පාසලේ ප්‍රජා ශක්ති උපරිම ලෙස පාසලේ යහපත පිණිස යොදවා ගැනීම විදුහල්පතිවරයාගේ කාර්යභාරයෙන් කොටසක් විය යුතු ය.

## 4.3 අධ්‍යාපන සැළසුම් ක්‍රියාවලිය

4.3.1 අනාගත අධ්‍යාපන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ජන හා නිවාස සංගණනයන්ට සමගාමීව පාසල් සංගණනයක් ද සිදු කළ යුතු ය.

4.3.2 ජාතික මට්ටමේ අධ්‍යාපන සැළසුම්කරණය සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ඉලක්ක හා ප්‍රතිපත්ති මත පදනම් විය යුතු ය. මේ සඳහා මධ්‍යම රජයේ හා සියලු පළාත් මට්ටම්වල සහභාගීත්වය හා සහයෝගය ලබා ගත යුතු ය.

4.3.3 අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය සැළසුම් කිරීමේ දී ආංශික සංවර්ධන ප්‍රවේශය යොදා ගත යුතු ය. බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික, අන්තර්ජාතික, රාජ්‍ය නොවන සංවිධාන ආදියෙන් ලැබෙන අධ්‍යාපනය සඳහා වූ ආධාර යොදවා ගැනීම පිළිබඳව සැළසුම් කිරීමේ දී අවබෝධතා ගිවිසුමක් තුළින් එම ආධාර සපයන ආයතන සමස්ත අධ්‍යාපන සංවර්ධන වැඩපිළිවෙලෙහි හා රාමුවෙහි කොටස් කරුවන් කරගෙන එකී ආධාර රජය හරහා පමණක් යෙදවිය යුතු ය.

4.3.4 අධ්‍යාපන සැළසුම්කරණ ක්‍රියාවලිය සඳහා සෑම අංශයකින්ම තොරතුරු ලබා ගත යුතු ය.

## 4.4 අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය

4.4.1 අධ්‍යාපන සැලසුම්කරණය සඳහා තොරතුරු ලබාගත යුත්තේ පහත දැක්වෙන පද්ධතීන්ගේන්ය.

- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය
- මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය
- භූගෝලීය තොරතුරු පද්ධතිය
- මානව සම්පත් තොරතුරු පද්ධතිය

4.4.2 වසර 2000 දී අරඹන ලද තොරතුරු පද්ධතීන් වඩා නිවැරදිව, කාර්යක්ෂමව හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය.

4.4.3 දැනට පවත්නා තොරතුරු පද්ධතිය පළාත්, දිස්ත්‍රික්ක, කොට්ඨාශ කාර්යාල හා පාසල් සමඟ සම්බන්ධ කළ යුතු ය. එමඟින් තොරතුරු යාවත්කාලීන කිරීමේ පහසු ව්‍යුහයක් පද්ධතිය තුළ සකස් කර තිබිය යුතු ය. මධ්‍යගත දත්ත ගබඩාවක් සමඟ සන්නිවේදන පද්ධතියකින් සම්බන්ධ වන ඕනෑම කෙනෙකුට මෙහි පොදු තොරතුරු ලබා ගත හැකි විය යුතු ය.

## 4.5 පාසල් අධීක්ෂණය හා මඟපෙන්වීම.

4.5.1 පාසල් සුපරීක්ෂණ කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කොට සමස්ථ අධීක්ෂණය හා සුපරීක්ෂණ ක්‍රියාවලියට මඟ පෙන්වීමක් ලබා දිය හැකි ය. මේ සඳහා පාසල් සුපරීක්ෂණ මණ්ඩලයක් නැවත පිහිටුවිය හැකි ය. නැතහොත් අධ්‍යාපන තත්ත්ව තහවුරුකරණය පිළිබඳ ඒකකය යටතට පාසල් අධීක්ෂණය හා සුපරීක්ෂණය අනුයුක්ත කළ හැකි ය.

4.5.2 පාසල් අධීක්ෂණය බාහිර මට්ටමෙන් මෙන්ම, අභ්‍යන්තරයෙන් ද සිදු කරන ආකාරයේ වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු ය.

4.5.3 අඛණ්ඩ ගුරු සංවර්ධනය සඳහා ගුරු මධ්‍යස්ථාන යොදවා ගන්නා අතර, සුපරීක්ෂණය හරහා ගුරු කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් ඇති කළ යුතු ය.

4.5.4 දැනට සේවයේ සිටින 3,000 කට වැඩි ගුරු උපදේශකවරුන්ගේ කාර්යභාරය නිර්වචනය කොට ඔවුන්ගේ වෘත්තීය ව්‍යවස්ථාපිත මටමකට ගෙන ආ යුතු ය. මේ සඳහා 2007 අප්රේල් මස 30

වැනි දින අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ඒකනායක කමිටු නිර්දේශ (2001) ක්‍රියාත්මක කළ යුතු වේ.

4.5.5 දැනට සිදු කෙරෙන ; නව අධ්‍යාපන සංවර්ධන කටයුතු, ගුරු පුහුණු කිරීම්, නව දැනුම ලබා දීම, අධීක්ෂණය, ආදර්ශ ඉගැන්වීම, විෂයානුබද්ධ තරඟ සංවිධානය කිරීම වැනි ගුරු උපදේශකවරුන්ගේ කාර්යභාරය ඊට වඩා විධිමත් පුළුල් පාසල් සුපරීක්ෂණ ක්‍රියාවලියක් කෙරෙහි යොමු කළ යුතු ය.

4.5.6 විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල පිහිටි වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතු පාසල් සුපරීක්ෂණය කර අවශ්‍ය ප්‍රතිකර්ම වහා යෙදීමට කටයුතු කළ යුතු ය. මේ සඳහා අවශ්‍ය ප්‍රවාහනය වැනි පහසුකම් සැපයිය යුතු ය.

4.5.7 සුපරීක්ෂණයෙන් හඳුනා ගන්නා විශිෂ්ඨ පාසල් සඳහා දිරි ගැන්වීම් හා තිළිණ ලබා දිය යුතු ය.

## 4.6 අධ්‍යාපන පර්යේෂණ

4.6.1 අධ්‍යාපන පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය තරම් මුදල් වෙන් කර දිරි ගැන්විය යුතු ය.

4.6.2 අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය පර්යේෂණ මත පදනම් විය යුතු ය. සෑම මට්ටමකදීම පර්යේෂණ සිදු කිරීමට උනන්දු කළ යුතු අතර, ගුරුවරු මූලික පර්යේෂකයන් විය යුතු ය.

4.6.3 දැනට පවතින අධ්‍යාපන ක්‍රමය හා පාසල් ගුරුවරුන් සම්බන්ධව දරුවන් දරණ ආකල්ප පිළිබඳව තොරතුරු ලබා ගැනීමට පෞද්ගලික මට්ටමින් දරුවන් සම්බන්ධ කරගෙන සමීක්ෂණයක් සිදු කළ යුතු ය.

4.6.4 ජාතික අධ්‍යාපන ආයතනය යටතේ විෂය මාලාව, ගුරු අධ්‍යාපනය හා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ සිදුවිය යුතු ය.

4.6.5 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් "ජාතික අධ්‍යාපන පර්යේෂණ සභාව" ක් පිහිටුවා සියලු මට්ටම්වල සිදුවන පර්යේෂණ සම්බන්ධීකරණය, ප්‍රතිඵල විස්තීරණය, ප්‍රවර්ධනය, උද්දීපනය හා සමාලෝචනය සිදු කළ යුතු ය.

4.6.6 ජාතික අධ්‍යාපන පර්යේෂණ සභාවට සාමාජිකයින් නියමිත සංඛ්‍යාවක් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වන අතර, පර්යේෂණ සභාව පහත සඳහන් කාර්යයන් සඳහා වග කිව යුතු ය.

(අ) සියලු අධ්‍යාපන පර්යේෂණ සංවිධාන සම්බන්ධීකරණය කිරීම.
(ආ) දේශීය පර්යේෂණ ප්‍රතිඵල විස්තීර්ණ කිරීම.
(ඇ) මූලික, ප්‍රතිපත්තිමය සහ ක්‍රියාකාරී පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
(ඈ) විද්‍යාත්මක අධ්‍යාපන පර්යේෂණ සඳහා හැකියා වර්ධනය උද්දීපනය කිරීම.
(ඉ) අධ්‍යාපන පර්යේෂණ සොයා ගැනීම් සමාලෝචනය කිරීම.
(ඊ) විදේශීය පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම.
(උ) අධ්‍යාපන පර්යේෂණ කිරීමට වෘත්තිමය විශේෂඥතා දැනුම ඇති පුද්ගලයින් උනන්දු කරවීම.
(ඌ) වාර්ෂිකව අධ්‍යාපන පර්යේෂණ සාකච්ඡා මුළුවක් [symposium] සංවිධානය කොට පැවැත්වීම.

## 4.7 කාර්යසාධනය හා පසු විපරම

4.7.1 අධ්‍යාපන පද්ධතියේ ගැටලු නිරාකරණය කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ සහභාගීත්වයෙන් කාර්යසාධන, සමාලෝචන හා සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවිය යුතු ය. එහි වගකීම් වනුයේ,

- ප්‍රතිපත්ති සමාලෝචනය, ප්‍රතිශෝධනය හා සංශෝධනය.
- සැළසුම්කරණය සඳහා මාර්ගෝපදේශනය හා විධාන සැපයීම.
- නියාමනය සඳහා ප්‍රමිතීන් නියම කිරීම.
- ජාතික ඉලක්ක සාධනය නියාමනය කිරීම ආදියයි.

## 4.8 සිසු විනය කළමනාකරණය

4.8.1 සිසු විනය පිරිහීමට මූලික හේතු හඳුනාගෙන ඒවාට ප්‍රතිකර්ම යෙදවිය යුතු ය. ඒ සඳහා පාසල් සංවර්ධන සමිතිය යටතේ පාසල් විනය කමිටුවක් පත් කර ක්‍රියාත්මක කළ යුතු ය.

4.8.2 රජයේ පාසල් වල සිසුන්ට ආවේණික පොදු නීති පද්ධතියක් සකස් කළ යුතු ය. එම නීති පද්ධතිය මුද්‍රණය කොට ශිෂ්‍ය අත් පොතක් හරහා සෑම දරුවෙකුටම ලබා දිය යුතු ය.

4.8.3 දරුවෙකු නීතියක් කඩ කළ විට ලැබෙන දඬුවම් ශිෂ්‍ය අත්පොතේ සටහන් වී තිබිය යුතු ය. කළු ලකුණු, පාසලෙන් පසු රඳවා ගැනීම්, පන්ති තහනම් කිරීම්, පාසලෙන් ඉවත් කිරීම ආදී වශයෙන් වේ. මේ සෑම දඬුවමක්ම දරුවා නිවැරදි කිරීමේ හා උපදේශන ලබා දීමේ ක්‍රියාවලියකට ද බද්ධ කළ යුතු ය.

4.8.4 නීති ආරක්ෂා කිරීම හා විනයවත් සදාචාර සම්පන්න හැසිරීම් සඳහා සිසුන්ට අභිනන්දන හා ධනාත්මක අභිප්‍රේරණ ලබා දිය යුතු ය. රතු ලකුණු, සහතික පත්, පදක්කම් ආදී වශයෙනි.

4.8.5 වරදට දඬුවම් හා සදාචාරයට අභිප්‍රේරණ හා ප්‍රතිපාදන ලබා දීමේ දී පරිපාලකයන් සාධාරණව හා සමානාත්මතාවයෙන් කටයුතු කළ යුතු ය.

4.8.6 සිසුන්ට දඬුවම් කිරීමේ දී අදාළ මානව හිමිකම් නීති, විනය නීති, සිසු අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර නීති ගැන අවබෝධයකින් ක්‍රියා කළ යුතු ය.

4.8.7 වරදක් සිදු කළ දරුවකු සදාකාලිකවම එම වරද සම්බන්ධයෙන් වරදකරුවෙකු ලෙස සලකමින් කටයුතු නොකිරීමට ගුරුවරුන් පෙළඹවිය යුතු ය.

4.8.8 ළමා හිතකාමී සුමට පරිසරයක් පාසල තුළ ඇති කොට ආදර්ශය මඟින් දරුවා තුළ ස්වයංපාලනය ගොඩනඟා ඒ සඳහා දෙමාපියන් ඇතුළු සියලු පාසල් ප්‍රජාවගේ සහයෝගය ලබා ගත යුතු ය.

4.8.9 දෙමාපියන්, විදුහල්පති හා ගුරුවරු දරුවන්ට ආදර්ශමත්ව කටයුතු කළ යුතු ය.

# 5 අධ්‍යාපන කාර්යමණ්ඩලය

අධ්‍යාපන ප්‍රතිපත්තිය වඩාත් කාර්යයක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද දක්ෂ, එමෙන්ම උතුම් මහජන සේවාවක් සඳහා කැපවුණු කාර්ය මණ්ඩල සේවාවක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වූ මූලධර්මයකි. එසේ වුවද පසුගිය වකවානුව දෙස ආපසු හැරී බලන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලවල වෘත්තීය සංවර්ධනය හා රැකියාවේ උසස්වීම්, ස්ථාන මාරුවීම් සඳහා පැහැදිලි හා විධිමත් වැඩපිළිවෙලක් නොවීම, විමධ්‍යගත කාර්යාල ද අධ්‍යාපන පද්ධතියෙහි එක් එක් මට්ටමට පැවරෙන කාර්යයන් හා එක් එක් තනතුරේ භූමිකා නිරූපණය පිළිබඳ පැහැදිලිතාවක් නොවීම, දීර්ඝ කාලයක් තිස්සේ නව පත්වීම් හා උසස්වීම් නිසි පරිදි සිදු නොකිරීම නිසා වඩාත් බරපතල වූ කාර්යයක්ෂම හා සුදුසුකම් සහිත නිලධාරීන්ගේ හිඟය ආදිය අවධානයට යොමුවිය යුතු ප්‍රතිපත්තිමය අවශ්‍යතාවන්ගෙන් සමහරකි.

උල්පතට වඩා ඉහළින් දියපහර නොගලන්නා සේ ගුරුවරයාගේ මට්ටමට වඩා ඉහළින් අධ්‍යාපනය ගමන් නොකරයි. අධ්‍යාපන ප්‍රතිපත්තිය කවර ලෙස නවීකරණය කළ ද, ගුරුවරයාගේ සේවා තත්ත්වය නඟා සිටුවීමෙන් තොරව ඵලදායී හා සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීම අසීරු ය. මේ නිසා අනිවාර්යයෙන්ම ගුරුවරුන් සංවර්ධනය කොට අඛණ්ඩව පෝෂණය කළ යුතු ය. උපාධිධාරීන්ගෙන් පමණක් සංයුක්ත වූ වෘත්තීය සුදුසුකම් සහිත දක්ෂ ගුරු බලකායක් ගොඩ නැගීම ගුරු අධ්‍යාපන ප්‍රතිපත්තියේ එක් අරමුණකි. එමෙන්ම ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා මෙතෙක් කල් අතපසු කර තිබූ ගුරු වෘත්තියෙහි හර වටිනාකම් පදනම් කොටගත් ආචාරධර්ම පද්ධතියක් ද සකස් කරගත යුතුව ඇත.

එසේම ශ්‍රී ලංකා ගුරු සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින ගැටලු නිරාකරණය කරමින් අධ්‍යාපන කාර්ය මණ්ඩලය වඩාත් කාර්යයක්ෂම හා තෘප්තිමත් සේවාවක් බවට පත් කිරීමේ අභිලාෂයෙන් මතු දැක්වෙන යෝජනා ගෙන එමු.

## 5.1 ගුරු අධ්‍යාපනය

5.1.1 උසස් කාර්ය සාධනයක්, නිපුණතාවයක් හා චර්යාධර්ම ඇති නිර්මාණශීලී, බහුශ්‍රැත, වෘත්තිමය ගුරුවරු ගොඩනඟා ගැනීමේ ඉලක්ක ඇතිව ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

5.1.2 ගුරු අධ්‍යාපන වැඩසටහන් සැළසුම් කිරීම, සංවර්ධනය කිරීම, සම්බන්ධීකරණය, තොරතුරු සැපයීම, තක්සේරු කිරීම, අධීක්ෂණය, තත්ත්ව සහතිකය හා ප්‍රමිතිය යන වගකීම් දැරිය හැකි "ගුරු අධ්‍යාපන මණ්ඩලයක්" අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇති කොට පවත්වාගෙන යා යුතු ය.

5.1.3 2025 වසර වන විට ලංකාවේ සියලුම ගුරුවරු උපාධිධාරීන් විය යුතු ය යන දැඩි ප්‍රතිපත්තිමය තීන්දුවකට එළඹී, එය සාක්ෂාත් කර ගැනීමට වුවමනා සියලු කටයුතු සැළසුම් කළ යුතු ය. දැනට

පාසල් පද්ධතියේ සිටින ගුරුවරුන් අදාළ උපාධි ලබා ගැනීමට දිරිමත් කළ යුතු ය. ප්‍රාථමික අංශය ද ඇතුළුව සමස්ථ අධ්‍යාපනය සඳහා බඳවා ගන්නා සියලු නව ගුරුවරුන් උපාධිධාරීන් විය යුතු ය. විශේෂ අවස්ථාවලදී පමණක් සුදුසු ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට පත් කර ගැනීමට ඉඩ තිබිය යුතු ය. නමුත් නියමිත කාල සීමාවකදී ඔවුන් උපාධිධාරී තත්ත්වයට ගෙන ඒම ජාතික අධ්‍යාපන ආයතනයේ වගකීම වේ.

5.1.4 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල පාඨමාලාවල කාල සීමාව අවුරුදු 4 දක්වා දීර්ඝ කර, එය උපාධි පාඨමාලාවක් බවට පත් කළ යුතු ය. රටට අවශ්‍ය සියලු ගුරුවරුන් ජාතික අධ්‍යාපන පීඨ හරහා සංවර්ධනය කර ගත යුතු අතර, එම උපාධි පාඨමාලා වලට ඇතුළත් කර ගැනීම උසස් පෙළ "Z" ලකුණ අනුව විය යුතු ය. අධ්‍යාපන විද්‍යා පීඨ හරහා ප්‍රාථමික ගුරුවරුන් සඳහා විශේෂ වූ උපාධි පාඨමාලාවක් ආරම්භ කොට අවශ්‍ය උපාධිධාරී ප්‍රාථමික ගුරුවරුන් බිහි කර ගත යුතු වේ.

5.1.5 දිවයිනේ පාසල්වල උසස් පෙළ දක්වා සියලු විෂයයන් ඉගැන්වීමේ විවිධ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැළපෙන පරිදි විවිධ අංශ හා විෂයයන් ආශ්‍රිත උපාධිධාරී විශේෂඥ ගුරුවරු සංවර්ධනය කර ගත හැකි වන පරිදි අධ්‍යාපන විද්‍යා පීඨවල පාඨමාලා සමාලෝචනය කොට වැඩි දියුණු කළ යුතු ය. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ද උපාධිධාරී ගුරුවරුන් යොදවා ගැනීම අනාගත ජාතික වගකීමක් ඇති කටයුත්තක් ලෙස සැළසුම් කළ යුතු ය.

5.1.6 ඉංග්‍රීසි ගුරුවරුන්ට අමතරව අනෙකුත් සියලු ගුරුවරු ඉංග්‍රීසි ප්‍රවීනයන් බවට පත් කිරීමේ ක්‍රමානුකූල වැඩ සැලැස්මක් ඇති කොට ක්‍රියාත්මක කළ යුතුය. විද්‍යා පීඨවල සියලු පාඨමාලාවලට ඉතා ඉහළ මට්ටමේ ඉංග්‍රීසි නිර්දේශයක් ඇතුළු කළ යුතු ය.

5.1.7 විශ්ව විද්‍යාල උපාධිධාරීන් ගුරු වෘත්තියට බඳවා ගැනීමේ දී ජාතික අධ්‍යාපන ආයතනය සකස් කරන, මාස තුනකට වැඩි පූර්ණ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීම අනිවාර්ය කළ යුතු ය.

5.1.8 ගුරු අධ්‍යාපනය හා අඛණ්ඩ ගුරු සංවර්ධනය කාර්යයක්ෂම කර ගැනීමට උවමනා මානව හා භෞතික සම්පත් නොමඳව සැපයිය යුතු ය.

5.1.9 ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය මඟින් දැනටමත් ලබා දෙන ගුරු අධ්‍යාපනය අගය කළ යුතු අතර එය අමාත්‍යාංශයේ සීමා මට්ටමෙන් ඔබ්බට විශේෂඥ ගුරු අධ්‍යාපන සුදුසුකම් වර්ධනය් කෙරෙහි යොමු කරවා ගත යුතු ය.

5.1.10 සියලු ගුරුවරු ස්වයං සංවර්ධනය සඳහා ප්‍රබලව යොමු කළ යුතු ය. ඒ සඳහා තමුන්ම දැනුම සොයා යමින් ද, නව කරුණු හා වත්මන් ප්‍රවණතා ගවේශනය කරමින් ද, ප්‍රවීනයන් වීමට සම්පත් හා දිරිදීම් ලබා දිය යුතු ය. මේ සඳහා ගුරුවරුන්ට ඉංග්‍රීසි දැනුම හා පරිගණක සාක්ෂණතාවය අත්‍යාවශ්‍ය වේ.

5.1.11 පාසල අඛණ්ඩව ගුරු සංවර්ධනය සඳහා ක්‍රමවත්ව යොදවා ගත යුතු ය. මෙකී ගුරු සංවර්ධනය; විෂය මාලා සංවර්ධනයට බද්ධ විය යුතු ය. ගුරු උපදේශකවරුන්ට පාසල ආශ්‍රිත ගුරු සංවර්ධනය හා සුපරීක්ෂණය සම්බන්ධ විශාල වැඩ කොටසක් ඉටු කළ හැකි ය. පාසලේ පළපුරුදු ජේයෂ්ඨ ගුරුවරු නවක ගුරුවරු; සංවර්ධනය කරන සුසාධ්‍යකරුවන් [Mentors] ලෙස පත් කළ යුතු ය.

5.1.12 වසර දෙකකට වතාවක් ගුරුවරුන් පාසලෙන් බැහැර අනිවාර්ය ප්‍රතිපුහුණුවකට යොමු කළ යුතු ය. මේ සඳහා ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන යොදවා ගත හැකි ය.

5.1.13 පාසලෙන් බැහැර සිදුවන ප්‍රතිපුහුණු කිරීම් පාසල් කාලයේ සිදු නොවිය යුතු ය.

5.1.14 මෙකී ප්‍රතිපුහුණු වැඩසටහන් ජාතික අධ්‍යාපන ආයතනයේ මෙහෙයවීමෙන් සිදුවිය යුතු අතර, ඒවා පැවැත්වීම ගුරු උපදේශකවරුන්ගේ වෘත්තිය වගකීම්වල කොටසක් විය යුතු ය.

5.1.15 ගුරුවරුන්ගේ සංවර්ධනයට හා පුහුණුවට සමගාමීව අඛණ්ඩ කාර්යඵල ඇගයීමක් හරහා ඔවුන්ගේ වෘත්තීය තත්ත්වය හා වැටුප් වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කොට ඔවුන්ගේ සංවර්ධනය දිරිමත් කළ යුතු ය.

5.1.16 ගුරු වෘත්තියේ නිවැරදිව නොයෙදෙන්නන් ගුරු වෘත්තියෙන් ඉවත්කර වෙනත් සුදුසු රාජ්‍ය සේවාවන්ට අනුයුක්ත කිරීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

## 5.2 ගුරු ආචාර ධර්ම පද්ධතිය

5.2.1 පිහිටුවනු ලබන අධ්‍යාපන කවුන්සිලයේ මෙහෙය වීමෙන් හෝ වෙනත් සුදුසු කමිටුවක ආධාරයෙන් ගුරු ආචාර ධර්ම පද්ධතියක් සකස් කළ යුතු ය.

5.2.2 මේ ආචාර ධර්ම පද්ධතියට ගුරුවරයෙකුගේ සියලු භූමිකා ඇතුලත් විය යුතු අතර ඒ හරහා ඔහු වෘත්තීය මට්ටමට ගෙන ආ හැකි විය යුතු ය.

## 5.3 ගුරු අධ්‍යාපනඥයින්ගේ වෘත්තීය සංවර්ධනය

5.3.1 අනාගත උපාධිධාරී වෘත්තියික ගුරුවරයෙකු බිහි කිරීමට හා පුහුණු කිරීමට දායක වන පුද්ගලයෙකු ලෙස ගුරු අධ්‍යාපනඥයන්ගේ කාර්යභාරය නැවත නිර්වචනය කොට ඒ තත්ත්වය ලබා ගැනීම සඳහා ගුරු අධ්‍යාපනඥයන් සංවර්ධනය කොට සුදුසුකම් ලබා දී පුරුදු පුහුණු කළ යුතු ය.

5.3.2 ගුරු අධ්‍යාපනඥයන්ගේ වෘත්තීය මට්ටම් හා සුදුසුකම් විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගේ මට්ටමට ගෙන ඒමට කටයුතු කළ යුතු ය. මේ සඳහා විශ්ව විද්‍යාල, අධ්‍යාපන පීඨ හා ජාතික අධ්‍යාපන ආයතනය ආදිය මඟින් අධ්‍යාපනපති හා අධ්‍යාපන දර්ශනපති [M.Phil] මට්ටමේ විශේෂ පශ්චාත් උපාධි පාඨමාලා සැළසුම් කර දියත් කළ යුතු ය.

## 5.4 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිළධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය

5.4.1 විදුහල්පති සේවයේ උසස්වීම් හා වැටුප් වර්ධක නිශ්චිත සුදුසුකම්, පුහුණුව හා පළපුරුද්ද අනුව ඉතා ක්‍රමවත් ලෙස බෙදා දීම නීතියක් කළ යුතු ය.

5.4.2 පාසල් කළමනාකරණය විමධ්‍යගත කළ හැකි වන පරිදි විදුහල්පතිවරයා නායකයෙකු මෙන්ම, කළමනාකරුවෙකු ලෙස ශක්තිමත් කළ යුතු ය.

5.4.3 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සුදුසු මට්ටම්වල නිළධාරීන් තමුන් මුහුණ දිය යුතු අභියෝගාත්මක අවස්ථාවලට තුලනාත්මකව මුහුණ දිය හැකි වන පරිදි ද, නායකත්වය වර්ධනය වන පරිදි ද සංවර්ධනය කළ යුතු ය. මේ සඳහා මීපේ නායකත්ව පුහුණු මධ්‍යස්ථානය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත යුතු ය.

5.4.4 තෙමසකට වැඩි කාලයක් සඳහා පුහුණුවීම් වලට විදේශගතවන මෙම මට්ටම්වල නිළධාරීන් ලවා පුහුණුව සඳහා වැය වන මුළු මුදලට සරිලන සේවා ගිවිසුමකට හෝ ඇප ඔප්පුවකට හෝ අත්සන් කර ගත යුතු ය.

5.4.5 අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව සංවර්ධනයට අදාළ සම්පූර්ණ තොරතුරු පද්ධතියක් පිහිටුවිය යුතු ය.

## 5.5 අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සේවා

**ශ්‍රී ලංකා ගුරු සේවය**

5.5.1 ගුරු සේවය සඳහා බඳවා ගත යුත්තේ විද්‍යාපීඨ උපාධිධාරීන් හෝ අවම වශයෙන් ත්‍රෛමාසික පාඨමාලාවකින් අධ්‍යාපනය පිළිබඳ උගත් විශ්ව විද්‍යාල උපාධිධාරීන් පමණි. ප්‍රාථමික අංශය සඳහා ද මෙය වලංගු විය යුතු ය. අවශ්‍යතාව සඳහා එවැනි ගුරුවරු නොමැතිවන සුවිශේෂ තත්ත්ව යටතේ පමණක් වෙනත් සුදුසු මට්ටමක ගුරුවරු බඳවා ගැනීමට ඉඩ තිබිය යුතු ය.

5.5.2 දැනටමත් සේවයේ යෙදී සිටින ගුරුවරු උපාධියක් දක්වා සංවර්ධනය කොට සමස්ථ ලංකාවේ සියලු ගුරුවරු උපාධිධාරීන් කිරීමේ ජාතික ඉලක්කයක් ඇති කොට එය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

5.5.3 ගුරුවරු බෙදී යාමේ විෂමතාවයන් නැති කිරීම සඳහා සියලු ගුරු පත්වීම් පාසල් පාදක හා විෂයපාදක පත්වීම් ලෙස ලබා දිය යුතු ය. පාසලකට ගුරු වැටුප් වෙන් කිරීම පාසැලේ ගුරු අවශ්‍යතාවය මත විය යුතු ය. ගුරුවරයෙකු බඳවා ගත යුත්තේ වසර 6 ක අනිවාර්ය සේවයක් සඳහා ය. වෙනත් පාසලක ඇබෑර්තුවක් සඳහා ගුරුවරයෙකු මාරු කළ යුත්තේ අදාළ පාසලේ ඇබෑර්තුව අහෝසි වන්නේ නම් හෝ ඒ සඳහා වෙනත් ගුරුවරයෙකු පත් වන්නේ නම් පමණි. අකර්මන්‍යතාවයකදී ගුරුවරු මාරු නොකොට වෘත්තියෙන් ඉවත් කිරීම මැනවි.

5.5.4 සුදුසුකම් ඇති ගුරුවරුන්ට වෘත්තීය බලපත්‍රයක් නිකුත් කිරීමේ බලය අධ්‍යාපන කවුන්සිලයට [EC] පැවරිය යුතු ය. එවිට "වෘත්තීය ගුරු බලපත්‍රය" නොමැති ගුරුවරයෙකු නීත්‍යානුකූල ගුරුවරයෙකු ලෙස පිළිගත නොහැකි වේ.

5.5.5 ගුරුවරුන්ගේ වාර්ෂික උසස්වීම් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා සංග්‍රහයේ නියම කර ඇති ක්‍රියාදාමය පිළිබඳව යළි සලකා බලා සුදුසුකම්, පළපුරුද්ද, පුහුණුව, දක්ෂකම්, කැපවීම් හා දුෂ්කර පළාත්වල සේවය ආදිය සලකා බලමින් උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම පිළිබඳ දැඩි නීති පද්ධතියක් පිළියෙළ කොට ක්‍රියාත්මක කළ යුතු ය. මේ සඳහා ගුරු කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු ය.

5.5.6 ගුරු මාරු කිරීම් සඳහා 2007.12.13 දින දරණ 2007/20 චක්‍රලේඛනයේ සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය. අළුතෙන් සකස් කරන ගුරු මාරු ක්‍රියාත්මක විය යුත්තේ ඊළඟ අධ්‍යාපන වර්ෂය ආරම්භයේ සිට ය.

5.5.7 ගුරු සේවයේ උසස්වීම් සඳහා දැනට පහත දැක්වෙන පන්ති හා ශ්‍රේණි භාවිතා කළ හැකි ය. එහෙත් අනාගතයේ පන්ති හතර පමණක් පවත්වා ගත හැකි ය.

3 වන පන්තිය ⟶ ( I හා II ශ්‍රේණි )
2 වන පන්තිය ⟶ ( I හා II ශ්‍රේණි )
1 වන පන්තිය
විශිෂ්ඨ පන්තිය

5.5.8 1 වන පන්තියේ හා විශිෂ්ඨ පන්තියේ ගුරුවරු සුදුසු විභාගයකින් හා සුදුසු පුහුණුවකින් පසු ගුරු උපදේශක මට්ටමට උසස් කළ හැකි ය. ඔවුන් සඳහා ව්‍යවස්ථාපිත සේවයක් ආරම්භ කළ යුතු

අතර, ඔවුන් අධ්‍යාපන කොට්ඨාශයන්ට අනුයුක්ත කළ යුතු ය. සේවාස්ථ ගුරු පුහුණු, විෂයමාලා ක්‍රියාත්මක කිරීම, ගුරු උපදේශනය හා පහසුකම් සැපයීම, පාසල් සුපරීක්ෂණය හා ඇගයීම මොවුන්ගේ කාර්යභාරය වේ.

5.5.9 නව පත්වීම් ලබන සෑම ගුරුවරයෙකු සඳහාම අවම වශයෙන් වසරක කාලයක් සඳහා පාසලේ සුදුසු ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙකු සුසාධ්‍යකාරකයෙකු [Mentor] ලෙස පත් කර නිසි මඟ පෙන්වීමක් කළ යුතු ය.

5.5.10 ගුරුවරු පත් කිරීමේ දී, ස්ථානගත කිරීමේ දී හා මාරු කිරීමේ දී ගුරුවරයා ප්‍රවීනත්වය දක්වන භාෂා මාධ්‍ය සැළකිල්ලට ගෙන ඒ අනුව සුදුසු පාසල්වලට පමණක් අනුයුක්ත කළ යුතු ය.

5.5.11 අනාගතයේ වසර හතරකින් පසු ඒ ඒ පළාත්වල මතුවිය හැකි විවිධ විෂයන් සඳහා වූ ගුරු පුරප්පාඩු හඳුනා ගැනීමේ ක්‍රමයක් සකස් කොට එකී අවශ්‍යතා අනුව විද්‍යා පීඨ වලට සිසුන් බඳවා ගත යුතු ය.

5.5.12 දුෂ්කර පළාත්වල සේවය කරන ගුරුවරු සඳහා නේවාසික පහසුකම් ඇතුළු සුදුසු දිරි දීමනා ලබා දිය යුතු ය.

5.5.13 දිස්ත්‍රික්ක මට්ටමෙන් විශිෂ්ඨ ගුරුවරු හඳුනාගෙන වාර්ෂිකව ඔවුන් අගය කරමින් ගුරු උපහාර උළෙලක් පැවැත්විය යුතු ය.

### ශ්‍රී ලංකා විදුහල්පති සේවය

5.5.14 ශ්‍රී ලංකා අධ්‍යපාන පරිපාලන සේවයේ නිළධාරීන් පළපුරුද්දක් ලබා ගන්නා අවස්ථාවක හැර සියලු විදුහල්පති තනතුරුවලට පත්විය යුත්තේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සිටින්නන් පමණි.

5.5.15 විදුහල්පති සේවයේ තනතුරු අපේක්ෂා කරන්නන් පාසල් කළමනාකරණය, පරිපාලනය හා නායකත්වය පිළිබඳ පශ්චාත් උපාධි හෝ ඩිප්ලෝමාධාරියෙකු විය යුතු ය.

5.5.16 නව විදුහල්පතිවරයෙකු පත් කිරීමේ දී විදුහල්පති සේවයේ අයකු පාසලකට අනුයුක්ත කළ යුත්තේ එහි සිටින විදුහල්පතිවරයා ඉවත් වීමට තෙමසකට පෙරය.

5.5.17 විදුහල්පතිවරු පත් කිරීමේ දී , උසස්වීම් වලදී හා මාරු කිරීම් වලදී ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථාවේ සඳහන් ක්‍රියා පිළිවෙල අනුගමනය කළ යුතු ය.

5.5.18 අත්‍යාවශ්‍ය අවස්ථාවක වැඩ බලන විදුහල්පතිවරයෙකු පත් කරන්නේ නම් එය මාස 3 කට පමණක් සීමා විය යුතු ය.

5.5.19 කැපී පෙනෙන සේවයක් කරන විදුහල්පතිවරුන්ට ජාතික මට්ටමේ පිළිගැනීමක් හා ප්‍රදානයන් සිදු කොට ප්‍රසිද්ධ ගෞරව කිරීමක් සිදු කළ යුතු ය.

5.5.20 මෙකී සේවා පුරප්පාඩු සඳහා පත්වීම්, උසස්වීම් දීමට පවත්වන සියලු තරඟකාරී විභාග වාර්ෂිකව පැවැත්විය යුතු ය.

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

5.5.21 අනාගතයේ බඳවා ගන්නා ගුරු අධ්‍යාපනඥයන් සඳහා අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි, ඉංග්‍රීසි දැනුම, අත්දැකීම්, කැපවීම හා අනෙකුත් අත්‍යාවශ්‍ය ගුණාංග සුදුසුකම් ලෙස සැළකිය යුතු අතර, ඔවුන් දිරිමත් වන මට්ටමේ වැටුප් තලයක් ද ඇති කොට අධ්‍යාපන විද්‍යා පීඨ පාඨමාලාව උපාධි මට්ටමට ගෙන ඒම කඩිනම් කළ යුතු ය.

5.5.22 මෙම සේවයේ පවතින පුරප්පාඩු මාස 6 කින් සම්පූර්ණ කළ යුතු අතර, සේවයේ යෙදී සිටින්නන් අදාළ මට්ටමට සංවර්ධනය කර ගත යුතු ය.

5.5.23 උසස් පෙළ දක්වා ගණිත, කලා, වාණිජ හා තාක්ෂණික යන විෂය ධාරා හා ඉංග්‍රීසි ද, ශාරීරික අධ්‍යාපනය වැනි විෂයන් ද, ඉගැන්විය හැකි දක්ෂ උපාධිධාරී ගුරු පිරිසක් අනාගතයේ අධ්‍යාපන විද්‍යා පීඨ වලින් බිහි කර දීමට තරම් සුදුසුකම් හා නිපුණතා ඇති විශේෂඥ ගුරු අධ්‍යාපනඥයන් අවශ්‍ය ප්‍රමාණයක් පද්ධතිය තුළට ඇතුළු කර ගත යුතු ය. මේ සඳහා එවැනි පුද්ගලයන් ගුරු අධ්‍යාපනඥ සේවය ආකර්ෂණය කර ගැනීමේ ක්‍රම වේදයක් සකස් කර ගත යුතු වේ.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

5.5.24 මෙකී සේවයට බඳවා ගැනීම්, උසස්වීම් හා මාරුවීම් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථාවට අනුකූලව පමණක් සිදු විය යුතු ය.

5.5.25 සේවයේ සෑම ධූරයකම කාර්යභාරය හා බලතල නිවැරදිව හා පැහැදිලිව නිර්වචනය කර, එකී කාර්යභාරයේ ස්වාධීන වගකීම් පැවරිය යුතු ය.

5.5.26 ඔවුන්ට කුසලතාවය හා ජ්‍යේෂ්ඨතාවය මත උසස්වීම් උපයා ගත හැකි විය යුතු ය.

5.5.27 ඒ ඒ පළාතේ භාෂා අවශ්‍යතාවය අනුව අදාළ භාෂාවන්ගෙන් නිපුන අධ්‍යාපන පරිපාලන නිළධාරීන් අවශ්‍ය තරම් සේවයේ යෙදවිය යුතු ය. ඔවුන්ට අවශ්‍ය බලතල ද ලබා දිය යුතු ය.

5.5.28 අධ්‍යාපන පරිපාලන සේවයේ නියුක්තින් පාසල් සඳහා චක්‍ර ලේඛන නිකුත් කිරීමේ දී එකවිටම භාෂා තුනෙන්ම නිකුත් කළ යුතු වීම නීතියක් කළ යුතු ය.

# 6

## අධ්‍යාපන ප්‍රමිති හා ගුණාත්මක තහවුරුව

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මුඛ්‍ය අරමුණ වන්නේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල මඟින් ලබා දෙන අධ්‍යාපනයේ සංවර්ධනය ඇති කිරීම හෝ පාසල් විෂයමාලාව ඇගයීම විභාග, ගුරු සේවය වැනි සංරචකවල සංවර්ධනයක් ඇති කිරීම ය. අධ්‍යාපන සංවර්ධන සංකල්පයක් ලෙස ගත් කළ අධ්‍යාපනයේ සියලු ම අංශවල ගුණාත්මය අදහස් කරයි. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ සන්දර්භය තුළ ගුණාත්ම තහවුරුව යනු අධ්‍යාපන ප්‍රතිපත්තිය හා ජාතික අරමුණු ඉටු කර ගැනීමේ දී නියමිත ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලියේ සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම නැතහොත් යෙදවුම් හා නිපැයුම් විධිමත් ලෙස විමර්ශනය කිරීම යි. මේ අනුව පාසල් විෂය මාලාව, පෙළපොත් ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම හා තක්සේරු කිරීම පිළිබඳ ගුණාත්මක තහවුරුව සඳහා ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය හා එහි නියෝජිත ආයතන සතු වගකීමකි. ඒ සම්බන්ධයෙන් සුදුසු ව්‍යවස්ථාපිත පදනමක් ප්‍රතිෂ්ඨාපනය කිරීම පිණිස මතු දැක්වෙන යෝජනා ඉදිරිපත් කරමු.

6.1 ශ්‍රී ලංකාවේ සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියේ සියලු මට්ටම්, අංශ හා පියවරයන්හි තිබිය යුතු පිළිගත හැකි අවම ප්‍රමිතීන් හා ගුණාත්මක බව ප්‍රමාණාත්මකව නිර්දේශ කොට ප්‍රසිද්ධ කොට ; “සැළසුම් කිරීම ⟶ ක්‍රියාත්මක කිරීම ⟶ පසු විපරම්” යන ප්‍රචලිත ක්‍රමවේදය හරහා එකී අවම මට්ටම ක්‍රමානුකූලව ඉහළට ඔසවමින් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීම හා අඛණ්ඩව තත්ත්ව සංවර්ධනය කිරීම ප්‍රමුඛතාවය ලබා දිය යුතු ජාතික මට්ටමේ ප්‍රධාන වගකීමක් වේ.

6.2 මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ 2001 වර්ෂයේ පිහිටුවන ලද තත්ත්ව තහවුරු කිරීමේ ඒකකයෙහි මානව හා භෞතික සම්පත් ජාත්‍යන්තර මට්ටමට සංවර්ධනය කර එය නියාමන තත්ත්ව තහවුරුකරණ හා සුපරීක්ෂණ ඒකකය ලෙස නම් කළ යුතු ය.

6.3 මෙම ඒකකයෙන් ක්‍රියාත්මක කරන ප්‍රමිතීන් හා තත්ත්ව සුරැකීමේ වැඩපිළිවෙල සඳහා පාසල් සුපරීක්ෂණය යන අංගය ද එකතු කොට නව අධ්‍යාපන පනත යටතේ එම ඒකකය ස්වාධීන ශක්තිමත් නෛතික පදනමක් යටතේ ස්ථාපිත කළ යුතු ය.

6.4 මෙම ඒකකයේ පාලනය ; විශේෂඥ දැනුමක් හා සුදුසුකම් ඇති පළපුරුදු, දක්ෂ හා ක්‍රියාකාරී තත්ත්ව පාලන හා සුපරීක්ෂණ කොමසාරිස් ජනරාල්වරයෙකු යටතට පත් කළ යුතු ය. ඔහුට තත්ත්ව පාලනය හා සුපරීක්ෂණය සඳහා අධිකාරී බලතල මෙන්ම ක්‍රියාත්මක වීමේ නීතිමය බලතල ද ලබා දිය යුතු යි.

6.5 මෙම ඒකකය යටතේ රජයේ හා පෞද්ගලික අංශයේ සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන පාසල්වල පහත දැක්වෙන අංගවල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය තහවුරු කළ යුතු ය. එනම් ජාතික පොදු අරමුණු, පාසල් දැක්ම හා මෙහෙවර, ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය, ඇගයීම් හා ප්‍රතිඵල, විෂයමාලා හා ඉගැනුම් ක්‍රමවේදය, පෙළ පොත්, ගුරු උපදේශන හා වැඩ පටිපාටි [Work schemes], සම්පත් ද්‍රව්‍ය යෙදවීම්, මානව යෙදවීම්, නායකත්වය හා කළමනාකරණය, ක්‍රියාකාරකම්, අභ්‍යන්තර හා බාහිර සුපරීක්ෂණය හා ඇගයීම, ප්‍රජා සහභාගීත්වය ආදී අංග යි.

6.6 තවදුරටත් කරුණු සලකා බැලීමෙන් පසු සුදුසු යැයි හැගේ නම් ගුරු උපදේශකවරුන් මෙම ඒකකය යටතේ ව්‍යවස්ථාපිත කොට පළාත් හරහා විමධ්‍යගත කළ හැකි ය. තත්ත්ව පාලනය හා තත්ත්ව තහවුරුකරණය සඳහා බාහිර ඇගයීම් වාර්තා ලබා ගැනීම සඳහා හොඳම ප්‍රභවය ගුරු උපදේශකවරු වේ. ඔවුන් ස්වාධීනව හා ඍජුවම ප්‍රධාන ඒකකයට වාර්තා කළ යුතු වේ.

6.7 පාසල් තුළ පිහිටුවන සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තත්ත්ව කවයන් [Quality circles] ඵලදායීව ක්‍රියාත්මක කිරීමෙන් පාසල තුළ අභ්‍යන්තර ඇගයීමක් කර තත්ත්ව සංවර්ධනය සඳහා ස්වයං උවමනාවක් ක්‍රියාවලියක් ඇති කිරීමට ධෛර්යමත් කළ යුතු ය.

6.8 අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දිස්ත්‍රික් කාර්යාල හා කොට්ඨාශ කාර්යාල යන සියලු අධ්‍යාපන පරිපාලන ආයතන වල ද සියලු අංශවල ගුණාත්මක යෙදවුම්, ක්‍රියාවලි හා නිමැවුම්වල තත්ත්ව සුපරීක්ෂණය හා තහවුරුකරණය මෙම තත්ත්ව තහවුරු කරන ඒකකය යටතට අයත් වේ. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමේ සිට පාසල් මට්ටම දක්වා විහිදෙන සුදුසු සංවිධාන ව්‍යුහයක් සකස් කර ගත යුතු වේ.

# 7

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් සම්පත්කරණය හා මූල්‍යකරණය

සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාව අධ්‍යාපන ප්‍රතිලාභ මුදුන්පත් කර ගැනීම සම්බන්ධයෙන්, ඉහළ මට්ටමකින් පැවතිය ද, අධ්‍යාපන දත්ත අනුව අධ්‍යාපන ආයෝජනය ප්‍රමාණාත්මකව අඩු මට්ටමකින් පවතී. අධ්‍යාපන වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 2000 දී 2.50 ක් ව පැවති අතර එතැන් සිට ක්‍රමයෙන් අඩු වී 2007 දී 2.10 දක්වා පහත වැටී ඇති අතර, 2008 දී එය 2.83 දක්වා ඉහළ නැග ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව බලන විට ශ්‍රී ලංකාව අධ්‍යාපනික අත්පත් කර ගැනීම් ඉහළ මට්ටමක පැවතිය ද, අධ්‍යාපනික ආයෝජනය අඩු අගයන් ගෙන ඇත. මේ තත්ත්වය ඉක්මවා දළ දේශීය නිෂ්පාදිතයෙන් මීට වඩා වැඩි ප්‍රතිශතයක් අධ්‍යාපන සඳහා යෙදවීම අවශ්‍යයෙන්ම සිදු කළ යුතු වේ. මෙම ප්‍රතිශතය 5% දක්වා වර්ධනය කළ හැකි නම් ජාතියක් වශයෙන් අප කාටත් සතුටු විය හැකි තත්ත්වයකි. එසේම සම්පත් යෙදවීමේ දී අධ්‍යාපන ප්‍රතිපත්තියේ අරමුණු හා කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, වඩාත් ප්‍රායෝගිකවුත් විනිවිද භාවයකින් ද සිදු කළ යුතු වේ.

7.1 පාසලකට මූල්‍ය සම්පත් ලබා දෙන ප්‍රධාන ප්‍රභවය රජයයි. මීට අමතරව පහසුකම් හා සේවා ගාස්තු, සමිති සමාජික ගාස්තු, සල්පිල්, ප්‍රදර්ශන, ප්‍රසංග, තරඟ ක්‍රීඩා, යටිතල පහසුකම් කුලියට දීම ආදී ක්‍රම මඟින් පාසල විසින්ම මූල්‍ය පහසුකම් උපදවා ගැනීමක් ද සිදු කරනු ලැබේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට හානියක් නොවන පරිදි ඉහත ක්‍රියාකාරකම් (පාසල් සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ) විනිවිද භාවයකින් යුක්තව සිදු කිරීම හරහා පාසල් නඩත්තුව සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සොයා ගැනීමට නීත්‍යානුකූලව ඉඩක් ලබා දිය යුතු ය. මේ පහසුකම් සලසා ගත නොහැකි පාසල්වලට වැඩි මූල්‍ය පහසුකම් රජයෙන් සැපයීම ප්‍රතිපත්තියක් විය යුතු ය.

7.2 රජය අයවැය මඟින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% දක්වා වැඩි කිරීමට උපරිම උත්සාහයක් දැරිය යුතු ය.

7.3 ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මත පදනම් වන ආංශික සංවර්ධන රාමුවට හා ප්‍රවේශ වැඩසටහනට [Sector-wide development frame work & approach] ගැලපෙන අයුරු අයවැය රාමුව සකස් කොට දියුණු කළ යුතු ය.

7.4 අමතර සම්පත් අවශ්‍යතා ඇති ස්ථාන වන අවාසිදායක මට්ටමේ පාසල්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනය, අන්තර්කරණ ක්‍රියාවලිය සිදුවන පාසල්, දුෂ්කර පාසල් ආදිය නිවැරදිව හඳුනාගෙන ඒවා සඳහා වැඩි භෞතික සම්පත් හා මානව සම්පත් සැපයිය යුතු ය.

7.5 අධ්‍යාපනයේ මූල්‍ය අවශ්‍යතා තීරණය කළ යුත්තේ පාසල් මට්ටමේ සිට ඉහළට ය. දැනට දැඩි මූල්‍ය රෙගුලාසි නිසා එකී රෙගුලාසි මුල් කරගෙන ඒවා අනුව සම්පත් බෙදා දිය යුතු ආකාරය තීරණය කළ යුතුව තිබේ. එහෙත් විය යුත්තේ අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය අනුව නිවැරදි සම්පත් බෙදා දිය හැකි වන පරිදි නීති රීති හා චක්‍රලේඛ සකස් කර ගැනීමයි.

7.6 ඉතා අඩු ආදායම් ඇති පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍යමය සහයෝගය හා සුභසාධනය නොමඳව ලබා දිය යුතු ය.

7.7 සම්පත් යෙදවීමේ දී අධ්‍යාපනයේ ජාතික අරමුණු හා කාලීන අරමුණු සැළකිල්ලට ගෙන එකී අරමුණු වෙත ළඟා වීමේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සැළකිල්ලට ගත යුතු ය. යෙදූ සම්පත් වලින් එකී අරමුණු කෙතරම් දුරට ඉටු වූයේ ද යන්න එනම්, යෙදවුම්වල ප්‍රතිඵලය පැහැදිලිව විනිශ්චය කොට සමාලෝචනය කළ යුතු ය.

7.8 පාසල් වැය ශීර්ෂය සැළසුම් කිරීම හා කළමනාකරණය පාසල් මට්ටමට විමධ්‍යගත කළ යුතු ය. ඒ අනුව පාසල් සංවර්ධන සමිතිය යටතේ ඇති පාසල් කළමනාකරණ කමිටුවේ සහයෝගය ඇතිව වැය පිළිබඳව තීරණ ගැනීමටත්, ක්‍රියාත්මක වීමටත්, විදුහල්පතිවරයාට හැකි විය යුතු ය.

7.9 සෑම පාසලක්ම වාර්ෂිකව විගණන හා කාර්යඵල සමාලෝචන වාර්තාවක් සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුණාත්මක සංවර්ධන ඒකකයට යොමු කළ යුතු ය.

7.10 හදිසි හෝ ආපදා අවස්ථාවක දී යොදවා ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික අධ්‍යාපන අරමුදලක් ඇති කොට එය පෝෂණය කරමින් පවත්වා ගත යුතු ය. අධ්‍යාපනයේ මූල්‍ය අවශ්‍යතාවයන් තීරණය කළ යුත්තේ පාසල් මට්ටමෙන් පටන් ගෙන ඉහළටය.

# 8 වෘත්තීය අධ්‍යාපනය

සාම්ප්‍රදායික විධිමත් පාසල් අධ්‍යාපනය මඟින් සපුරාලිය නොහැකි අවශ්‍යතා ඉටු කිරීම සඳහා නිදහසින් පසු අප රට අධ්‍යාපන ඉතිහාසයේ වැඩ ලෝකය හඳුන්වා දීම, වැඩ හුරුව, ප්‍රාග්වෘත්තීය අධ්‍යාපනය, ජනතා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය යනාදී වශයෙන් විවිධ සංකල්ප යටතේ වරින්වර වෑයම් දරා ඇතත්, පාසලින් පසු විශ්ව විද්‍යාලයට හෝ කෙළින්ම රැකියාවකට ප්‍රවේශවන අය අතහැර සෙසු අයගේ අනාගතය පිළිබඳ ගැටලුව තවමත් නොවිසඳුනු ප්‍රශ්නයක් වශයෙන් ශේෂ වී පවතී. බැලූ බැල්මට මෙය නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයෙන් හා වගකීමෙන් බැහැර අංශයක් බව පෙනී ගිය ද පාසල් හැරයන දරුවන් පාසලින් ඉවත්ව යාමට පෙර ඔවුන් සඳහා සුදුසු වෘත්තීය අධ්‍යාපනයකට යොමු කිරීමේ වගකීම සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිපත්තියක් වශයෙන් සලකමු. මෙම අරමුණ තව වැඩිදුරටත් ඉන් ඔබ්බට සංවර්ධනය කර පාසල් පැවැත්වෙන කාලයෙන් පසු සවස් කාලයේ දී සහ සති අන්ත හා පාසල් නිවාඩු කාලවලදී පාසැලේ භෞතික සම්පත් පරිහරණය කරමින් එම දරුවන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා සත්‍ය වශයෙන්ම දායක විය හැකි අධ්‍යාපනික වැඩපිළිවෙලක් යෙදිය හැකි ය. මේ සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගත හැකි වන අවබෝධතා ගිවිසුමකට එළඹ ඩිප්ලෝමා සහ උපාධි සහතික දක්වා ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කර ගැනීමේ සක්‍රීය වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ.

8.1 ජාතික විශ්වවිද්‍යාල අධ්‍යාපන අවස්ථා නොලබන්නා වූ, සා.පෙළ හා උ.පෙළ අධ්‍යාපනයෙන් පසු පාසල් හැරයන සිසුන් එසේ පාසලෙන් ඉවත් වීමට පෙර සුදුසු වෘත්තීය අධ්‍යාපනයකට බද්ධ කිරීම සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිපත්තියක් විය යුතු ය.

8.2 සාමාන්‍ය පාසල් අධ්‍යාපනය අවසන් කරන දරුවෙකුට සා.පෙළ හෝ උ.පෙළ ජාතික විභාග සහතිකයට අමතරව පාසල තුළ ඔහු ලබා ගත් දැනුම, කුසලතා හා ආකල්ප නිරූපණය වන ආකර්ශනීය සහතිකයක් නිකුත් කළ යුතු ය. මෙය අස්වීමේ සහතිකයක් නොවන අතර එහි ශිෂ්‍යයා ද්විතීයික මට්ටමේ හදාරන ලද විවිධ විෂයන් හා ඒ ඒ විෂය සඳහා යෙද වූ සමස්ථ කාලය ද පාසල් පාදක අඛණ්ඩ ශිෂ්‍ය ඇගයීම්වල ප්‍රතිඵල ද, විෂයානුබද්ධ, විෂය සමගාමී හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් හා ක්‍රීඩා ආදිය පිළිබඳ සාර්ථකත්වය නිරූපණය කරන දත්තයන් ද අන්තර්ගත විය යුතු ය. මේ සහතිකය සඳහා ජාතික මට්ටමේ පොදු ව්‍යුහයක් නිර්මාණය කොට යොදවා ගත යුතු ය. මෙයින් ශිෂ්‍යයා අසමත් වූවෙකු නොව උගත්, යමක් කළ හැකි දක්ෂයෙකු බව පෙන්නුම් කෙරෙනු ඇත.

8.3 මෙම සිසුන් තුළ උපදේශන සේවා හරහා ඔවුන්ගේ හැකියාවන් ගැන දැඩි ආත්ම විශ්වාසයක් හා ආත්ම අභිමානයක් ද ඇති කොට වෘත්තියක් පිළිබඳ අනාගත බලාපොරොත්තු ඉහළ නංවා පාසලෙන් ගිලිහී යා නොදී ඔවුන් සඳහා පාසල් පාදක වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පාසල් තුළම ආරම්භ කළ යුතු ය.

8.4 මේ සඳහා පස්වරුවේ හෝ/හා සති අන්තවලදී දැනට පවතින පාසල් යටිතල පහසුකම් යොදවා ගත යුතු වේ. ද්විතීයික පාසල් දහසේ තාක්ෂණික විද්‍යාගාර මේ කටයුත්තට අපූරු ලෙස ගැලපේ.

8.5 මෙකී වෘත්තීය අධ්‍යාපන පාඨමාලා විදුහල්පතිගේ අධීක්ෂණය යටතේ ; යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් පැවැත්විය යුතු ය. මේ සඳහා අමාත්‍යාංශ අතර සුදුසු අවබෝධතා ගිවිසුමක් ඇති කර ගත යුතු වේ.

8.6 සරල කළමනාකරණ මූලධර්ම, සරල ගිණුම්කරණය, ව්‍යවසායකත්වය, ප්‍රායෝගික ඉංග්‍රීසි, සන්නිවේදන තාක්ෂණය මෙකී ආරම්භක පාඨමාලාවේ හර විෂයන් විය යුතු අතර, ශිෂ්‍යයා තෝරා ගන්නා වෘත්තීය ක්ෂේත්‍රයන් අනුව අදාළ අනෙකුත් විෂයන් සකස් කර ගත යුතු ය.

8.7 මෙකී සිසුන් පාසලට නොපැමිණෙන කාලය තුළ (එනම් පෙරවරුවේ) ප්‍රදේශයේ යම් ආයතනයක තාවකාලික රැකියා පුහුණුව හා අත්දැකීම් ලැබීම සඳහා අනුයුක්ත කළ හැකි ය. මෙවැනි සිසුන්ට ඉඩ දීම හා පුහුණු කිරීම සඳහා පෞද්ගලික හා රජයේ ආයතන ජාතික මට්ටමෙන් උනන්දු කළ යුතු ය. මේ සඳහා තමා තෝරා ගන්නා වෘත්තීය ක්ෂේත්‍රයම ගලපා ගැනීම වැදගත් වේ.

8.8 පාඨමාලාව අවසානයේ ශිෂ්‍යයන්ට අදාළ නිපුණතා සහතික පත්‍රය ලබා දී ඔවුන් අදාළ වෘත්තීය ක්ෂේත්‍රයට ගැළපෙන පාඨමාලා ඇති කාර්මික විද්‍යාලයකට හෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට ඇතුළු කළ යුතු ය. තමා යෙදී සිටි තාවකාලික රැකියා පුහුණුවේ දිගටම යෙදීමට ඔවුන් ධෛර්යමත් කළ යුතු ය.

8.9 මේ පාඨමාලා තාක්ෂණික ඩිප්ලෝමාවක් හා අනතුරුව වෘත්තීය අධ්‍යාපන උපාධියක් දක්වා දීර්ඝ විය යුතු ය.

8.10 මෙසේ දරුවෙකුගේ සාමාන්‍ය අධ්‍යාපනය හරහා උපාධිය දක්වා සංවර්ධන මාර්ගය අවසාන පිටුවේ දැක් වේ.

# 9 පිරිවෙන් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ ඉතා පැරණි අධ්‍යාපන ඉතිහාසයකට උරුමකම් කියන පිරිවෙන් අධ්‍යාපනය සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියකට බැහැරව සමගාමී වෙනම පනතක් යටතේ දැනටමත් ක්‍රියාත්මක වේ. පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය හා යාවත්කාලීන කිරීම සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශයේ සහ ගරු මහනායක ස්වාමීන් වහන්සේලාගේ උපදෙස් පරිදි පිරිවෙන් පනත සංශෝධනය කරමින් නවීකරණය කළ යුතු වේ. පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආගමික දැනුම, අවබෝධය, අධ්‍යාත්මික සංවර්ධනය, උන්වහන්සේලාගේ සැඟවුණු කලා කුසලතා ඔප් නැංවීම හා සමාජ සුභසාධන පොදු ජන සේවා පිළිබඳ නවීන ප්‍රායෝගික අධ්‍යාපනයට නැඹුරු කිරීමය. මෙහිදී සීලමාතා පිරිවෙන හඳුන්වා දීම, පිරිවෙන් පුහුණු ආයතන ඇති කිරීම හා පිරිවෙන් විෂයමාලා යාවත්කාලීන කොට නවීකරණය කිරීමට ප්‍රමුඛතාව හිමිවනු ඇත.

9.1 පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ පනත පහත දැක්වෙන අයුරින් සංශෝධනය කළ යුතු ය.

- (අ) වගන්තිය ; අරියන්ති, පටිපත්ති, පටිවේදී යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුව ඇති කිරීම හා වර්ධනය කිරීම.

- (ආ) උප වගන්තිය අවසානයේ දක්වන "ඇති කිරීම" යන්නට "ඇති කිරීම හා වර්ධනය කිරීම" යන වචන යෙදීම.

- (ඇ) උප වගන්තිය "සැරියුත් මුගලන් පරපුරෙන් පැවත එන සහ පරපුර අවිච්ඡින්නව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන විනය ත්‍රිපිටක ඥානය, ධර්මගරුක බව භික්ෂූන් වහන්සේලා වෙත ඇති කිරීම හා වර්ධනය කිරීම" යනුවෙන් සංශෝධනය විය යුතු ය.

- (ඈ) උප වගන්තිය, "බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර, විෂයාන්තර හා සමයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට සහ ගිහි ශිෂ්‍යන්ට පහසුකම් සළසා දීම" යනුවෙන් සංශෝධනය විය යුතු ය.

9.2 සීල මාතාවන්ගේ සහ සීල මාතා පිරිවෙන් අධ්‍යාපන ආයතන තුළ ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන ගිහි ශිෂ්‍යයාවන්ටද අධ්‍යාපන සුදුසුකම් සැලසීම අරමුණු කර ගත් සීල මාතා පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ද මෙම පනතින් විධි විධාන සැලසීම.

9.3 කාරක සභා අවස්ථාවලදී පිරිවෙන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් පිරිවෙන් මණ්ඩලය රැස් වී තීරණවලට පැමිණ බුද්ධ ශාසන අමාත්‍යාංශය හරහා අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ හැකි විය යුතු ය.

9.4 පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ භික්ෂු හා පැවිදි කාන්තා පිරිවෙන් හා පුහුණු ආයතන පිහිටුවීම.

9.5 පිරිවෙන් මණ්ඩලය පත් කිරීමේ දී නිකායවල මහනායක ස්වාමීන් වහන්සේලා දැනට නිල බලයෙන් පත් වෙති. ඊට අමතරව අධ්‍යාපන ඇමතිවරයා විසින් පාලි, සංස්කෘත භාෂා, ධර්මය, අධ්‍යාත්මික වර්ධනය හා භාවනා ක්‍රම පිළිබඳ දැනුමක් ඇති, විෂයෙහි ප්‍රවීණ ස්වාමීන්වහන්සේලා සුදුසු සංඛ්‍යාවක් ද පත් කළ යුතු ය.

9.6 පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ භික්ෂූන් වහන්සේලා අධ්‍යාත්මික සංවර්ධනයටත් සමාජ සේවා කටයුතුවලටත් යොමු වූ ප්‍රායෝගික අධ්‍යාපනයකට නැඹුරු කරවීම යි.

9.7 පිරිවෙන් අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේ තුළ සැඟව ඇති චිත්‍ර, මූර්ති වැනි කලාවන් ඔප්නැංවීමට අවස්ථාව ලබා දීම.

9.8 සුදුසු ශ්‍රේණි සඳහා පෙරවරුවේ පන්ති ආරම්භ කිරීමට පිරිවෙන් වලට අවස්ථාව ලබා දිය යුතු ය.

9.9 පිරිවෙන් පාඨමාලාවල විෂය පථය සුදුසු පරිදි පුළුල් කළ යුතු ය.

---

# අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ව්‍යුහය



# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කළමනාකරණ ව්‍යුහය



<u>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - කළමනාකරණ ව්‍යුහය</u>

